# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක්  www.budusarana.lk  Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නිකිණි අමාවක පෝදා 2022 අගෝස්තු 26 සිකුරාදා BUDUSARANA FRIDAY AUGUST 26, 2022
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 11 පත්‍රය, පිටු 10 ආරම්භය 1965 - 06 - 13



මුනික ජාතක කතාව ඇසුරිනි

# වස විෂ ගිනි සතුරු විපත් වැඩි ද?
# මෙලෙස ආරක්ෂා වෙමු

**භාවනාව වැඩීමේ දී ප්‍රධාන වශයෙන් කෙරෙන්නේ රූපාදී විවිධ අරමුණු ඔස්සේ සිතූ සේ දුවන සිත එක් යහපත් අරමුණක පිහිටුවා ගැනීමයි. චිත්ත ඒකග්ගතාව යි. ඒකාග්‍ර වූ සිතේ නොසන්සුන්කම තුනීවී අරමුණ කෙරෙහි ඇතිවන ගැටීම හෙවත් ව්‍යාපාදය මැඩපවත්වා ඉවසීම සහ මෛත්‍රිය පුරුදු කරයි.**

මෙහිදී සිතෙහි හටගන්නා රාග, දෝස, මෝහ, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, මානය, සැකය ආදී ක්ලේශ ධර්මයන් එක්වර දුරු කළ නොහැක. ක්‍රමයෙන් බැහැර කළ යුතු ය.

ඇස, කන, නාසය, දිව ශරීරය යන ඉන්ද්‍රියයන් මඟින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු සිතට ලැබේ. අභාවිත සිත ඒ අරමුණු නිත්‍ය ය. මම ය මාගේ ය , ශුභ ය, සුඛ ය කියා වැරැදි ලෙස ගනී. සිත කෙලෙසුන්ගෙන් කිලිටි වන්නේ මේ වැරැදි හැඟීම නිසා ය.

භාවනාවෙන් දියුණු කළ සිත ඒ අරමුණු දෙස බලන්නේ ඇලීමකින් හෝ ගැටීමකින් නොවේ. පිරිසුදු සිතකින් පමණයි, යථාර්ථය අවබෝධ කොට නිවන් දැකීමට පුළුවන් කමක් ලැබෙන්නේ.

භාග්‍යවතුන් වහන්සේ වදාළේ , මෛත්‍රීය වැඩීම, බොහෝ ආනිසංස ලබා ගන්න පුළුවන් ක්‍රියාවක් බවයි. එම ආනිසංස දැන ගැනීමට මත්තෙන් එය දේශනා කරන්නට හේතූ පාදක වූ අතීත කතා පුවත විමසා බලමු.

දිනක් තථාගතයන් වහන්සේ මහා සංඝ රත්නය පිරිවරාගෙන කොසොල් රටේ චාරිකාවක වැඩියා. ඒ ගමන් මඟ වැටී තිබුණේ වනාන්තරයක් මැදින්. ඒ වනයේ ලැව් ගින්නක් නිසා විශාල වනස්පතියක් නැත්නම් විශාල නුග ගසක් ගිනි ගෙන තියෙනවා. ඒ ගින්න නිවි නිවී පත්තුවෙනවා. විශාල කඳක් මේ ගිනි ගෙන තියෙන්නේ.

මේ ගිනිගත් ගස දැකලා බුදුන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට මතක් කළා, ආනන්ද මෙතැන ටික වේලාවක් විවේක ගනිමු" කියලා. ඒ වෙලාවේ ආනන්ද ස්වාමින් වහන්සේ සෙවණ තියෙන ගසක් යට ආසනයක් පනවලා බුදුන් වහන්සේට ආරාධනා කළා , ස්වාමින් වහන්ස මෙතැනින් වැඩ සිටින්න" කියලා. ඒ ආසනයේ වැඩ සිටින බුදුන් වහන්සේ අර ගිනි ගෙන තිබෙන ගස පෙන්නලා එදා ඒ සඟ පිරිසට ඉතාමත් හොඳ ධර්ම දේශනාවක් පැවැත්තුවා.

ගිනිකඳ උපමා කර ගෙන දේශනා කළ නිසා ඒ සූත්‍රයට කියනවා අග්ගික්ඛන්ධෝපම කියලා. මේ සූත්‍රයේ සිව්පසය පරිහරණය කරන පිළිවෙළ පිළිබඳවත්, සිල්වත් භාවය පිළිබඳවත් විස්තර දැක්වෙනවා. මේ සූත්‍ර දේශනාවට සවන් දුන් භික්ෂුන් වහන්සේලා හැට නමකට ලේ වමනය ගියා. තවත් 60 නමක් සිවුරු හැර ගියා. සිල්වත් කමක් නැති ව සිව් පස පරිභෝගයේ ආදීනව දැකලා දුස්සීල ව හිටපු භික්ෂුන් වහන්සේ භය වුණා. ඒ අතර පිරිසුදු සිල්වත්, ගුණවත් භික්ෂූන් වහන්සේලා හැට නමක් රහත් වුණා.

මේ දේශනාව අසා දැනගත් දෙව් දේවතාවෝ මධ්‍යම රාත්‍රියේ දී ආකාශ තලයේ හිඳගෙන භික්ෂුන් වහන්සේලාට මේ සූත්‍රය ඇසෙන පරිදි කියන්න පටන් ගත්තා. භික්ෂූන් වහන්සේ මේ සූත්‍ර දේශනාවට සවන් දීලා භය වුණා. තමන් පිළිබඳ කලකිරුණා. සංවේගයට පත් වුණා. අනේ මහණකම මොන තරම් දුෂ්කර ද කියලා.

භය වෙලා සිවුරු හැර යන්න පටන් ගත්තා. දැන් සේනාසන පාළුවුණා. භික්ෂුන් වහන්සේලා අඩු වුණා. සිල්වත් උතුමන් වහන්සේලා පවා සිවුරු හැර යන්න පටන් ගත්තා. අන්න ඒ අවස්ථාවේ ආනන්ද ස්වාමින් වහන්සේ බුදුන් වහන්සේ ළඟට පැමිණ ඉතා ගෞරවයෙන් දෙපා වැඳ ඉල්ලීමක් කළේ , ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අග්ගික්ඛන්ධ සූත්‍රය දේශනා කළාට පස්සේ භික්ෂුන් වහන්සේ භයටත්, සංවේගයටත් පත් වෙලා ඉන්නවා. ඒ නිසා අපට සැනසුම පිණිස තවත් දේශනයක් පවත්වන සේක්වා කියලා.

ඒ ආරාධනාවට අනුව භික්ෂුන් වහන්සේලාට සැනසුම පිණිස මේ මෙත්තානිසංස සූත්‍රය දේශනා කොට වදාළා.

මේ සූත්‍රය ආනිසංස දේශනාවක්. මෛත්‍රී භාවනාව වඩන ගිහි වේවා, පැවිදි වේවා. මනා ලෙස මෙත් වඩන කෙනකුට ලැබෙන අනුසස් එකොළහක් මේ සූත්‍රයෙන් දේශනා කොට වදාළා. දැන් අපි මේ සූත්‍රයේ තේරුම කෙටියෙන් බලමු.

මහණෙනි මේ මෛත්‍රී භාවනාව මෙන්න මේ විදියට පුරුදු පුහුණු කළ යුතුයි. ඒ සඳහා ඉතාමත් ලස්සන වචන පෙළක් ඉරිපත් කර තිබෙනවා

,මෙත්තාය භික්ඛවේ චේතෝ විමුත්තියා, ආසේවිතාය භාවිතාය බහුලීකතාය, යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඉමේ ඒකාදසානිසංසා පාටිකංඛාති.

ආසේවිතාය - මෛත්‍රී භාවනාව ආදරයෙන් ආරම්භ කළ යුතුයි.

භාවිතාය - නැවත නැවත වැඩිය යුතුයි

බහුලීකතාය- බහුල ව වැඩිය යුතුයි

යානි කතාය - ධාවනය කරන යානාවක් වගේ සූදානම් කරගෙන වැඩිය යුතුයි.

වත්ථුකතාය. ගොවියෙක්, කුඹුරු කිරීමට පොළොව සකස් කරගන්නා සේ නිතරම මෛත්‍රිය සකස් කර ගත යුතුයි.

අනුට්ඨිතාය - නිතරම අවධියෙන් සිටින කෙනෙක් වගේ මෛත්‍රීයෙන් සිත අවධි කර ගත යුතුයි.

පරිචිතාය -



ගාල්ල දංගෙදර , ශ්‍රී ජයවර්ධනාරාම පුරාණ මහා විහාරාධිකාරී
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක
**මුතුකණ්ඩියේ සුනෙත්ත හිමි**

සිත ඕනෑ ම අවස්ථාවක මෛත්‍රී භාවනාවට යොමු කර ගත හැකි පරිදි පුරුදු කර ගත යුතුයි.

සුසමාරද්ධාය - අතට ගත් දෙයක් වගේ සෑම විට මෛත්‍රීය සූදානම් ව තබා ගත යුතුයි.

මේ ආකාරයට මෛත්‍රී භාවනාව ප්‍රගුණකර ගත් කෙනකුට ලැබෙන අනුසස් එකොළහක් තියෙන බව මෙලෙස දේශනා කොට වදාළා.

- සුඛං සුපති
- සුඛං පටිබුජ්ඣති
- න පාපකං සුපිනං පස්සති
- මනුස්සානං පියෝ හෝති
- අමනුස්සානං පියෝ හෝති
- දේවාතා රක්ඛන්ති
- නාස්ස අග්ගි වා විසංවා සත්ථං වා කමති
- තුවටං චිත්තං සමාධියති
- මුඛවණ්ණෝ විප්පසීදති
- අසම්මූළ්හෝ කාලං කරෝති
- උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ බ්‍රහ්මලෝකූපගෝ හෝති

- සැප සේ නිද යි,
- සැප සේ පුබුදියි,
- නපුරු සිහින නොදකියි,
- මිනිසුන්ට ප්‍රිය වෙයි.
- නොමිනිස්සුන්ට ද ප්‍රිය වෙයි,
- දෙවියෝ රකියි,
- මෛත්‍රී විහරණ ඇති පුද්ගලයාගේ සිරුරෙහි, ගිනි හෝ, විස හෝ, සැත් හෝ නොවදියි,
- වහා සිත සමාහිත වෙයි,
- මුහුණ පැහැපත් වෙයි,
- නොමුළාව කලුරිය කරයි.

මෛත්‍රී පූර්වක සිතින් එක් සත්ත්වයකුට වුව ද මෙත් වඩා ද එයින් බොහෝ කුසල් අත්වේ. සකල සත්ත්වයින්ට ම මෛත්‍රිය වඩන්නා ඉමහත් ආනිසංස ලබයි.

එනිසා අප ද නොපමාව මෛත්‍රී සහගත සිතිවිලි ඇති කර ගෙන ජීවිතේ සැනසීම ඇති කර ගනිමින් සමාධිමත් සිතකින් සත්‍ය අවබෝධය කර ගැනීමට වීර්ය ය වඩමු.

“දසබලයන් වහන්සේ විසින් දේසිත ,අමා මහ නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති, ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි, උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින් බොහෝ කල් ගලා බස්නා සේක්වා.



# කෙලෙසුන් කෙරෙන් දුරු වූ කල ලැබෙන අසීමිත සුවය



**ලොව පහළ වූ සෑම සියලු ආගමකින් ම කිසියම් නිදහස් වීමක්, විමුක්තියක් කරා පුද්ගලයා යොමු කරවනු ලැබේ. බ්‍රහ්මජාල සූත්‍රයේ දී පංචදිට්ඨ ධම්ම, නිබ්බාණවාද යනුවෙන් විවිධ විමුක්තීන් ගැන ඉගැන්වූ වාද පහක් පිළිබඳ සඳහන් වෙයි.**

බුදුදහම පෙන්වා දෙන විමුක්තිය හැඳින්වෙන්නේ නිර්වාණ (නිබ්බාණ) නිවන යන නමින් ය බුදු දහම තුළ ඉගැන්වෙන පරම, නිෂ්ටාව නිර්වාණය යි. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව් පිරිසේ ම අවසානික පරමාර්ථය නිර්වාණය යි.

අභිධර්මයට අනුව සතර පරමාර්ථ ධර්ම අතුරෙන් සිව්වන පරමාර්ථය ද නිර්වාණය යි. බුදුවරුන් ලොව පහළ වනුයේ එකී නිර්වාණගාමී මාර්ගය ලොවට හෙළි පෙහෙළි කර දීමට ය. මේ ඒ පිළිබඳ සංක්ෂිප්ත සටහනකි.

නිර්වාණය වූ කලි පරම සුවයකි නිරාමිස අත්දැකීමකි. ඒ පිළිබඳ අපට බුද්ධ දේශනාව ඇසුරෙන් කරුණු දක්වනු විනා නිර්වචන ඉදිරිපත් කළ නොහැකි හෙයින් අනිර්වචනීය වේ. වචනයෙන් නිවනෙහි ස්වභාවය පැහැදිලි කිරීම අපහසු බැවින් අවාචීය වේ. එය අවේදයිත සුවයෙකි. පරම සත්‍යයකි. සංයුත්ත නිකායෙහි අසංඛත සංයුත්තයෙහි නිවන හැඳින්වීමට යෙදෙන පර්යාය පද 33ක් මෙසේ දැක්වේ.

**"අසංඛත අන්තං අනාසවං සච්ච පාරං නිපුණං සුදුද්දසං අජරං ධුවං අපලෝකිතං අනිදස්සනං**

**නිප්පපඤ්චං සන්තං අමතං පණීතං සිවං ඛෙමං තණ්හක්ඛයො අච්ඡරියං අබ්භූතං අනීතිකං**

**අනීතිකධම්මං නිබ්බානං අබ්‍යාපජ්ජෝ විරාගො සුද්ධිං මුත්ති අනාලයො දීපො තාණං ලෙණං සරණං පරායණං"**

චක්ෂුරාදී ඉන්ද්‍රිය පඤ්චකයෙන් රූපාදී ආරම්මණයන් කරා පුහුදුන් සිත ඇදී යයි. එයින් එතෙක් ප්‍රභාෂ්වරව පැවැති චිත්තය කෙලෙසීමට පත්වේ. සත්ත්වයා සාංසාරික වශයෙන් දුක්ඛයට පමුණුවන්නේ මෙසේ කිලිටි වූ සිත මඟිනි. රාග, ද්වේෂ, මෝහ, තෘෂ්ණා, ඊර්ෂ්‍යා, මද, මාන, ප්‍රමාද මක්ඛාදී අනේකවිධ චෛතසිකයෝ අප සන්තානගතව රජයමින් පුද්ගලයා සාංසාරික දුක්ඛයට ඇද දමනු ලැබේ.

මෙසේ අවිද්‍යා මෝහාන්ධකාරයෙහි සත්වයා ඇලී ගැටී සිටිනා සමයෙක බුදුවරු ලොව පහළ වනුයේ යා යුතු මාර්ගය පෙන්වා දීමට ය.

"තුම්හෙහි කිච්ඡං ආතප්පං අක්ඛාතාරො තථාගතා" යන බුදු වදනින් එය පැහැදිලි ය බුදුරදුන් පෙන්වා දෙන ධර්ම මාර්ගය අනුපූර්ව ප්‍රතිපදාවකි පිළිවෙළින් යා යුතු මාර්ගයකි.

මෙසේ ක්ලේශ ධර්මයන්ගෙන් ආතුර වී සිටිනා සත්වයන් ධර්ම මාර්ගයට ගැනීම පහසු නොවේ.

ධර්ම ශ්‍රවණයෙන්, ධර්ම මාර්ගයේ ගමන් කිරීමෙන් සුවපත් මනසක් ගොඩ නැඟේ. එය දිගින් දිගට ම වර්ධනය කිරීම තුළ දාන, ශීල, භාවනාදී ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා ඔස්සේ සිත මෙහෙයවා ශීල සමාධි ප්‍රඥා යන ත්‍රිශික්ෂාවන් වර්ධනයෙන් කෙලෙස් රජස් කසට සහමුලින් ම සිඳලිය හැකි ය. ගසක මුදුන් මූලය කපා ඉවත් නොකරන තුරු කොතෙක් ගස කපා දැමුව ද නැවත නැවත ලියලන්නා සේ තෘෂ්ණාව සහමුලින් ම දුරු කරලන තුරු සත්වයා නැවත නැවත සසර දුකට බඳුන් වේ.

එකී වර්ධනීය මානසිකත්වයේ උපරිම ස්වභාවය රහත් බවයි. ඒ තත්වයට පත් ආර්ය ශ්‍රාවකයා ඛීණාසව, අන්තිම දේහධාරී, කතකිච්ච ආදී විවිධ නම්වලින් හැඳින්වෙන අතර, ලෞකික ලෝකයෙන් නිදහස් වූ කෙනකු බවට පත් වේ. ලෝකෝත්තර වේ

"භව නිරොධො නිබ්බානං" (අංගුත්තර නිකාය 901) යන්නෙන් නිර්වාණය නම් භව නිරෝධය බව පැහැදිලි කළ සේක. භවය නම් ස්ඛන්ධයන්ගේ පහළ වීමයි. භවයක් නැත්නම් නිර්වාණයක් ද නැත "යෙහි කෙචි භික්ඛවේ සමණා වා බ්‍රාහ්මණා වා අත්තානං සමනුපස්සන්තී සබ්බේ තෙ පඤ්චුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති" (ඛන්ධ සංයුත්ත 475)

යම් මහණ බමුණෙක් ආත්මය දකී නම්, ඔවුහු පඤ්චස්ඛන්ධයෙහි ම ඒ ආත්මය දකිතැයි දේශනා කළ සේක. තථාගතයන් වහන්සේ බාහිරකයන් විසින් පඤ්චස්ඛන්ධයෙහිලා ගණන් ගනු ලබන ආත්මයක් ද නොමැති හෙයින් පඤ්චස්ඛන්ධය අනාත්ම යැයි වදාළහ. නිර්වාණය ඒ ආත්ම - අනාත්ම ධර්ම දෙකින් ම මුක්ත ය. පස්කඳ නිවුණු කල්හි ආත්ම දෘෂ්ටියක් පහළ නොවන නිසා 'අනාත්ම' යැයි කීමට ද ඉඩක් නැත.

නිවන් සුවය අවේදයිත සුවයෙකි. සුඛ - දුක්ඛ - උපේක්ඛා වශයෙන් පවත්නා හැම වේදනාවක් ම "

යංකිඤ්චි වෙදයිතං සබ්බං තං දුක්ඛස්මින්ති" (සංයුත්ත නි 684) යනුවෙන් හැම වේදනාවක් ම දුකෙහි ඇතුළත් වන බව දේශනා කළ සේක. ස්ථිර වශයෙන් සදා කල්හි ම නොනැසී පවත්නා වේදනාවක් නැත. එහෙයින් අනිත්‍ය ය. යමක් අනිත්‍ය නම්, එය දුකකි. නිවන අවේදයිත සුවයකැයි වදාරණ ලද්දේ ඒ නිසා ය.

එක් කලෙක සැරියුත් මහ රහතන් වහන්සේ රජගහනුවර වේළුවනාරාමයේ දී භික්ෂූන් අමතා "සුඛමිදං ආවුසො නිබ්බානං, සුඛමිදං ආවුසො නිබ්බානන්ති" ඇවැත්නි මේ නිවන සුවදායක ය. ඇවැත්නි මේ නිවන සුවදායක ය යනුවෙන් වදාළහ.

එවිට උදායි තෙරණුවෝ ඇවැත් ශාරිපුත්‍රයන් වහන්ස, මේ නිවනෙහි විඳිමක් නැතිනම් පවත්නා සුවය කවරේදැ යි ඇසූහ. ඉක්බිති සැරුයුත් තෙරණුවෝ ඇවැත්නි, මෙහි ඇති සැපය නම් වේදනාවක් (විඳීමක්) නැති බව ම මිස අනෙකක් නොවේ යැයි ප්‍රකාශ කළ සේක.

මෙය තවදුරටත් පහදාලන ශාරිපුත්‍ර මාහිමියෝ මෙසේත් වදාළහ.

'ඇවැත්නි, මෙලොව යම් මහණකු පස්කම් සුවයෙන් වෙන් ව ප්‍රථම ධ්‍යානය ලබා වාසය කරන විට යම්කිසි කාම සහගත හැඟුමක් පහළ වේ නම්, එය ඔහුට ආබාධය පිණිස පවත්නේ ය.

යම් ඒ ආබාධයක් වේ නම්, එය දුකකැයි භාග්‍යවතුන් වහන්සේ වදාරණ ලදී. මේ අනුව ද නිවන සුවයැ යි දනිවු එසේම ද්විතීය ධ්‍යානය ලැබුවහුට විතර්ක සහගත හැඟීම් ද, තෘතීය ධ්‍යානලාභියාට ප්‍රීති සහගත හැඟීම් ද චතුර්ථ ධ්‍යානලාභියාට උපේක්ෂා සහගත හැඟීම් ද ආකාසානඤ්චායතනලාභියාට රූප සහගත හැඟීම් ද, විඤ්ඤණඤ්චායතනලාභියාට විඤ්ඤණඤ්චායතන සහගත හැඟීම් ද නේවසඤ්ඤා නාසඤ්ඤායතනලාභියාට ආකිඤ්චඤ්ඤායතන සහගත හැඟීම් ද, ආබාධය පිණිස පවත්නා බවත් වදාළහ.

නේවසඤ්ඤා නාසඤ්ඤායතනයත් ඉක්මවා ආශ්‍රව ක්ෂය කොට සඤ්ඤාවේදයිත නිරෝධයට සම වදින්නේ වේ ද, මේ නිසා ද නිවන සැප බව දත යුතුයැ යි වදාළහ.

සඤ්ඤාවේදයිත නිරෝධය ද අවේදයිත නිසාම සුවය බව පෙන්වීමට මෙය ප්‍රකාශ කළහ නිරෝධ සමාපත්තියට සම වැදීමෙන් මෙලොවදී ම නිවන් සුවය විඳිය හැකි ය.

නිවන වූ කලි ප්‍රාර්ථනා කොට හෝ පරලොව දී ලබා ගත හැක්කක් නොවේ මෙලොව දී ම අත්දැකිය හැකි සාන්දෘෂ්ඨික සත්‍යයකි ඒ සඳහා ඉතිඋත්තක පාළි දුක නිපාතාගත නිබ්බාන ධාතු සූත්‍රය නිදර්ශන ය. නිවනෙහි අවස්ථා දෙකකි.

- සෝපධිසේස නිබ්බාන ධාතු
- අනුපධිසේස නිබ්බාන ධාතු

පඤ්චස්ඛන්ධය පමණක් ඉතිරිව තිබියදී කෙලෙස් ප්‍රහාණය කිරීමෙන් උතුම් රහත් බව පසක් කිරීම, නොඑසේ නම් කෙලෙස් පරිනිර්වාණය සෝපධිසේස නිබ්බාන නම් වේ.

එසේ රහත් බව පසක් කළ රහතන් වහන්සේ පඤ්චස්ඛන්ධයාගේ බිඳී යාමෙන් (මරණයෙන්) පරිනිර්වාණයට පත් වීම අනුපධිසේස පරිනිර්වාණය යි.

නුවණින් ස්පර්ශ කළ යුතු වූ නිවන 'මෙසේය' යි හඳුන්වාලිය හැකි කිසි නිදර්ශනයක් නැති දහමකි. ඉපදීම - විනාශය සහ පවත්නා සත්වයාගේ වෙනස් වීම ය යන ස්වභාවයන් (අන්තයන්) නැති හෙයින් අනන්ත ය. යම් කවර හෝ තැනකින් මහ මුහුදට බස්නා කෙනෙකුන්හට ඒ ඒ තැන් තොටුපළ වන්නා සේ ම අටතිස් කමටහන් අතුරින් අභිමත කමටහනක් වඩා නිවන් ලබනු රිසි වන්නේ නම්, ඒ හැම කමටහනකින් ම නිවන් යා හැකි හෙයින් නිර්වාණය නැමැති සමුදුර හැම පැත්තෙන් ම තොටුපළ ඇත්තකි. ඒ නිවනෙහි පඨවි - ආපො - තෙජො - වායො යන මේ මහාභූතයෝ නොපිහිටන්නා හ. එහි දිග - කොට බව හා කුඩා මහත් බව ද ශුභාශුභ බව ද නාම රූප දෙකද ඉතිරි නොකොට සම්පූර්ණයෙන් ම නිරුද්ධ වන්නේ ය.

ඒ රහතන් වහන්සේගේ චුති සිතේ අවසන්හි පඤ්චස්ඛන්ධ දුක්ඛය නිරවශේෂයෙන් ම ප්‍රහීණ වන්නේ ය.

මෙසේ රහතන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පඤ්චස්ඛන්ධ දුක්ඛය නිවී යන බව තථාගතයන් වහන්සේ දේශනා කළ සේක.

" නිබ්බන්ති ධීරා යථායම් පදීපො" යනුවෙන් ඒ රහතන් වහන්සේ චුති සිත නිරුද්ධ වීමෙන් පහනක් නිවී යන්නා සේ නිවෙන බව බුදුරදහු රතන සූත්‍රයේ දී වදාළහ.

නිවන මෙබඳු යයි කී විට ඇතැම් පුහුදුන් පින්වතුන් නිවන සිය නුවණට නොවැටහෙන හෙයින් නිවනක් නැත' යි කියන්නට යුහුසුළු වනවාට සැකයක් නැත.

එසේ කියතොත් එය කිසි දිනෙක හිරු එළිය නුදුටු ජාත්‍යන්ධයකු 'හිරු එළියක් නැත' යි කීමට නොදෙවැනි කීමක් බවත්, දියේ ම වාසය කොට පුරුදු මාළුවකු 'ගොඩබිමක් නැත' යි තම යහළු ඉදිබුවකු සමඟ කළ තර්කය සේ ද නුවණැත්තන්ගේ මහත් හාස්‍යයට ලක් කළ යුතු තර්කයෝ වෙති.

පූර්වෝක්ත කරුණුවලට අනුව නිර්වාණය යනු පුද්ගල සන්තානගත පරිවර්තනයක් බව පැහැදිලිය. සිත කෙලෙසුන් කෙරෙන් දුරු වූ කල්හි දැනෙන අසීමිත සුවය නිර්වාණ සුවය යි එය උතුම්ම සැපයැ යි. 'නිබ්බානං පරමං සුඛං' එය අවේදයිත සුවයක් බවත්, හේතු ප්‍රත්‍ය සමවායෙන් සකස් නොවුණක් බැවින් අසංඛතයකි. නිවන් අවබෝධ කරනු කැමැතියන් විසින් පළමුව ශීලයෙහි පිහිටා අනතුරුව සිතත්, ප්‍රඥාවත් වැඩිය යුතු ය.

---

තල්පෙ, මාකඳුගොඩ නිග්‍රෝධාරාම මහා විහාරාධිකාරී, ගා/ සිරි ඤාණරතන මූලික පිරිවෙනෙහි
නියෝජ්‍ය පරිවෙණාධිපති, රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, විනයාචාර්ය
**බුත්තල ඤාණාධාර හිමි**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

නිකිණි අමාවක 2022-08-26

# දුර්වලතා හඳුනාගනිමු

උසස් මනසක් ලැබීම නිසාම සත්ත්ව ලෝකයේ පළමු තැන මිනිසාට හිමි ය. සිතා බලා කටයුතු කරන්නට, හොඳ නරක විමසන්නට හැකියාව තිබුණ ද කෙනකුගෙන් කෙනකුට වෙනස් චරිත ස්වභාවයන් සමාජය තුළ විද්‍යමාන වේ. කෙනෙක් යහපත් ව දිවි ගෙවති. කෙනෙක් අයහපතෙහි ම ගැලී සිටිති. ඒ යහපත අයහපත තුළ දෝලනය වෙමින් සැනසුම සේ ම වැනසුම අත්පත් කර ගනිති.

බොහෝ දෙනෙක් කරදරේ වැටෙන්නේ තමන්ගේ තරම නොදන්නාකම නිසා ය. තමන් කවුදැයි හඳුනා නොගැනීම නිසා ය. කෙනෙක් වයසට නොගැලපෙන දේ කරති. තවත් කෙනෙක් ඉවක් බවක් නොමැතිව අනුන් කරන දෙය අනුකරණය කරන්නට ගොස් වැනසෙති. කෙනෙක් නොහැකියාවන් වසා ගනිමින් හැකියාවන් ඇතැයි පෙන්වීමට ගොස් අමාරුවේ වැටෙති. කෙනෙක් කළ හැකි නොහැකිකම් පෙන්වා දුන්න ද අනුන්ගේ බසට අවනත වෙන්නට ඇති නොකැමැත්ත නිසා ද ප්‍රශ්න ගැටලු ඇති කර ගනිති. කවර ලෙසකින් කීව ද මේවා ජීවිතය අවුල් කරන දුර්වලතා ය. ඒවා හඳුනා ගනිමින් මඟහරවා ගන්නා තරමට නිරවුල් ජීවිතයක් ගත කිරීමට පහසු ය.

ජීවිතය අඳුරට ඇද දමන එවැනි දුර්වලතා පහසුවෙන් හඳුනා ගන්නට අවශ්‍ය සදුපදේස අපට දහම් මඟ තුළ ඕනෑ තරම් ඇත. ඉතා කුඩා සංසිද්ධියකින් පවා ජීවිතයට ලැබෙන ඒ ආදර්ශය කල්‍යාණ මිතුරකු සේ අපේ ජීවිතයට මඟ පෙන්වයි. රැකවරණය ලබා දෙයි.

අතීතයේ බරණැස් නුවර බඹදත් නම් රජ කෙනෙක් විය. එකල අප මහ බෝසතාණන් වහන්සේ වීරක නමින් දියකාවෙක් ව ඉපිද විලක් සමීපයෙහි වාසය කරමින් සිටියේ ය. මෙ සමයේ බරණැසට මහා සාගත කාලයක් උදාවුණි. ආහාර හිඟවිය. සතා සිවුපාවුන්ට පවා බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන්නට සිදුවිය. දිනක් සවිට්ඨක නම් කපුටෙක් සිය කැවිඩිය සමඟ බෝසත් දියකාවා හමුවට ආහ. බෝසතුන් දෙන ආහාරයෙන් කුස පුරවා ගනිමින් එහිම වසන්නට වූහ.

“අනුන් දෙන ආහාරයෙන් යැපෙන්නේ කුමට ද? අප දෙදෙනා ම රූපයෙන් පැහැයෙන් සමානයි. මට මගේ ආහාර සොයා ගන්නට පුළුවනැ’යි දිනක් කපුටා සිතීය. ඒ බව බෝසත් දියකාවාට පැවසී ය. දිය යට කිමිද ආහාර සෙවීම කපුටකුට කළ නොහැකි යැයි දියකාවා පැහැදිලි කර දුන්නේ ය. එහෙත් කපුටා එය නොපිළිගත්තේ ය. ආහාර සොයා ගෙන එම්’යි දිය යට ගියේ ය. අවාසනාවකි. දිය සෙවෙල්වල පැටළුණු කපුටාට නැවත දිය මතුපිටට ඒමට නොහැකි විය. එහි ම මළේ ය. කපුටා නොදුටු කැවිඩිය බෝසතාණන් වහන්සේගෙන් ඒ ගැන විමසීය. බෝසතාණන් වහන්සේ කපුටා තමන්ගේ තරම නොදැනීමෙන් කරගත් විපත ගැන කීවේ ය. කැවිඩිය හඬා වැළපී ආපසු බරණැස් නුවරට ම ගියා ය.

මේ ජාතක කතා පොත් වහන්සේ තුළ එන වීර (වීරක) ජාතක කතාවේ අතීත කතාවේ සාරාංශයකි. පෙර සඳහන් කළ ලෙස දුර්වලතා හඳුනාගෙන, ජීවිතය හසුරුවා ගන්නට මේ බෝසත් කතා පුවතින් ලැබෙන ආදර්ශය ම මොන තරම් පිටුවහලක් වෙනවා ද?

අප අතර බොහෝ දෙනෙක් අනුන්ගේ බසට කන් නොදෙති. දරුවන් මව්පියන්ට , ගුරුවරුන්ට, ඇහුම්කන් නොදෙති. හිතුවක්කාර තීරණයන්හි අවසානය ඇතැම් විට ජීවිතය පවා අහිමිවන විනාශයක් විය හැකි ය.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, විනෝදයට මුහුදේ හෝ ගංගාවල දිය නාන්නට ගොස් ගිලී මිය යාම වීර ජාතකයේ එන කී දේ නෑසු කපුටාට සිදුවූ විපත හා සමාන සිදුවීම් ය. මේ, සමාජයේ බහුලව දැකිය හැකි උදාහරණ ය. පුංචි දුර්වලතාවක අවසානය මහා විපතක් විය හැකි ය. බෞද්ධ සාහිත්‍යය තුළ අපට දුර්වලතා හඳුන්වා දෙමින් ඒවා මඟ හැර යන්නට මඟ පෙන්වයි. අප කළ යුතු ඒ ආදර්ශ ජීවිතයට ප්‍රායෝගික කර ගනිමින් සැනසීමෙන් ජීවත්වීම ය.



# පරාජයට නොපැරදී ජයග්‍රහණය හඹා යන්න

**සැවැත් නුවරවැසි තෙරුන් වහන්සේ නමක් විය. දිනක් උන්වහන්සේ බුදුරජාණන් වහන්සේ වෙත එළඹ රහත් බව ලබන පිණිස, භාවනා කර්ම ඉගෙන භාවනාවේ යෙදීම සඳහා වෙනත් නිස්කලංක ප්‍රදේශයකට වැඩියහ. වැඩ විසීමට පිළියෙළ වූ සුදුසු තැනක් දැක එහි වැඩ සිටිමින් භාවනා වඩමින් විසූහ. එසේ වැඩ සිටිමින් තමන් වහන්සේගේ අභිප්‍රාය මුදුන්පත් කැර ගැනීමට වෑයම් කළ ද එය ඉටු කර ගත නොහැකි විය.**

එසේ වූව ද මේ තෙරුන් වහන්සේ මදකුදු අලස නොවූහ. සිත - කය දෙකෙහි වීර්යය අඩු නො කළහ. රෑ - දවල් දෙකේ භාවනා වැඩීම සඳහා වෙහෙසුණහ. ඒ කිසි උත්සාහයකින් ද, තමන් වහන්සේගේ අදහස් සඵල කැර ගැනීමට නොහැකි විය. භාවනා පිළිවෙත් තවදුරටත් ඉගෙනීම පිණිස බුදුරජාණන් වහන්සේ වෙත යළි යෑමට සිත් විය.

එසේ අරමුණු තබාගෙන බුදුරජාණන් වහන්සේ වෙත යෑමට මඟට පිවිසුණහ. එසේ මඟ වඩින තෙරුන් වහන්සේට වඩින මඟ වෙනත් තැනක හට ගැණුනු විශාල වූ ලැව්ගින්නක් පෙනුණි. ලොකු කුඩා දැව දඬු - පරඬලා දැවී දැවී විසිරී දිවෙන ඒ මහ ලැව්ගින්න පැතිරෙන පෙදෙසෙන් වහා ඉවතට ගොස්, ගස් කොළ අතුවලින් නො ගැවසුණ ගල් සහිත කන්දක් දැක එහි මුදුනෙහි ගලකට නැඟ ලැව් ගිනි දෙස බලා සිටියහ.

ඒ මහා ගින්නෙන් දවා හළු කරන, එක සේ දැවෙන මහ වනය දැක උපමා ලෙසින් ගෙන එම තෙරුන් වහන්සේ මෙසේ සිතන්නට වූහ.

“අහෝ මේ මහ ගින්න මේ මහ වනයෙහි කුඩා ගස් ද, මහ ගස් ද, දැව දඬු - පරඬලා ද දවා හළු කොට විසරෙන්නේ ය. මේ සසර බැඳුම් ද එසේ වන්නේ යැයි මේ ආකාරයෙන් සිතූහ.

සසර බැඳුම් වන රැහැන් ආදී කුදු මහත් කෙලෙසුන් රහත් මඟ නැණ නමැති ගින්නෙන් දවා අලුකොට නිවනින් සැනසිය යුතු ය යැයි සලකා එයට ම සිත යොමු කළහ.

ගඳ කිළියේ වැඩ සිටි බුදුරජාණන් වහන්සේ ඒ තෙරුන් වහන්සේගේ වෑයම ද, උත්සාහය ද, භාවනාවට සිත යොමුව පිරිසුදු නුවණ පහළ වූ බව ද දුටු සේක.

> **“අහෝ මේ මහ ගින්න මේ මහ වනයෙහි කුඩා ගස් ද, මහ ගස් ද, දැව දඬු - පරඬලා ද දවා හළු කොට විසිරෙන්නේ ය. මේ සසර බැඳුම් ද එසේ වන්නේ යැයි මේ ආකාරයෙන් සිතූහ. සසර බැඳුම් වන රැහැන් ආදී කුදු මහත් කෙලෙසුන් රහත් මඟ නැණ නමැති ගින්නෙන් දවා අලුකොට නිවනින් සැනසිය යුතු ය යැයි සලකා එයට ම සිත යොමු කළහ.”**

**අප්පමාද රතො භික්ඛු**
**පමාදෙ භයදස්සී වා**
**සංයෝජනං අණුං ථූලං**
**ඩහං අග්ගී ව ගච්ඡති**

පමා බැව්හි බිය දැක මහණ දම් වඩන තැනැත්තා කුදු මහත් සසර බැඳුම් වූ රැහැන් දවන්නේ ය.

ආලෝකය පතුරුවා ඒ තෙරුන් හමුවේ, වැඩ සිටින සේ පෙනී සිට ඔබ වහන්සේගේ සිතිවිල්ල යහපත් ය. සසර සැරිසරන මේ සත්වයන් නැවත නැවත ඉපදීම් වශයෙන් බැඳ තබන ලොකු කුඩා කෙලෙස් රැහැන් මේ විසල් වූ ලැව් ගින්නෙන් දැවෙන, ලොකු - කුඩා ගස් වැල් හා දැව - දඬු සේ රහත් මඟ නැණින් තවා වනසා, නිවන වැද නැවත ඉපදීමට අවකාශ නො තැබිය යුතු යැයි දෙසා වදාළ සේක.

රහත්ඵල පමා බැවින් කල් යැවූ ඒ තෙරුන් වහන්සේ රහත් ඵලයෙහි පිහිටි සේක.

පෘතග්ජන අප ද ධර්මයේ හැසිරීමේ දී හෝ ඉගෙනීමේ දී හෝ වෙනයම් වූ කාර්යයක දී තමන් බලාපොරොත්තු වූ දේ ඒ ආකාරයෙන් ම ඉෂ්ඨ නොවූ කල ඒ දේ හරියන්නේ නැතැයි සිතිය යුතු නොවේ.

අධෛර්යවත් නොවිය යුතු යි. නැවත නැවතත් ඒ දේ වෙනුවෙන් උත්සාහවත් විය යුතුයි. වැරදුණු තැන කොතැන ද? අඩුපාඩුවක් වූයේ තොනැන ද? යන්න විමසිය යුතු ය. එසේ විමසා බලා වැරදුණු තැන සකස් කර ගනිමින්, ඒ දේ වෙනුවෙන් උත්සාහවත් විය යුතු ය. අපගේ උත්සාහයේ, උනන්දුවේ තරමට ප්‍රතිඵල ළඟාකර ගත හැකි වන්නේ ය.

දීපා පෙරේරා

# අනුන්ට උපකාර කරන අයට

# සොබාදහමත් රැකවරණය දෙනවා



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ**
**අමරවංශ හිමි**

**පෙර ලංකාද්වීපයේ පිහිටා තිබුණා දණ්ඩගෝණ නම් ගමක් කුඹුරු, වැව්, පොකුණු, අමුණු ආදියත්, මහා වනාන්තරයකුත් මේ ගම අලංකාර කළා. ගම් වැසියන් ජීවත්වීමට කළේ කුඹුරු ගොවිතැන, හේන් ගොවිතැන් සහ ගවපාලනය ආදිය යි.**

මීකිරි විකුණා තම අඹුදරුවන් රක්ෂා කරන ගොපල්ලෙක් හිටියා. කඩිසර ගතියෙන් වගේම කරුණාව පිරුණු හදවතකින් ද යුක්ත අයෙක්. බිරිඳටත්, දරුවන්ටත්, නෑදෑයන්ටත්, අසල්වැසියන්ටත්, හිතවතුන්ටත් උදව් උපකාර කරමින්, දුකේ දී පිහිට වෙමින් ධර්මානුකූල ජීවිතයක් ගත කළා. කිසිම වංචාවක් කළේ නෑ.

සත්‍ය වචන කතා කළා. කියන දේ කළා. මේ ගොපල්ලා දවසක් වෙනදා වගේ ම බිරිඳ උයාදුන් කෑම පාර්සලයත් අරගෙන ගවයන්ට තණ කැවීමට මහා වනයට ඇතුළු වුණා.

මේ කැලයේ ජීවත් වුණා කාණසිගාල කියන සිවලෙක්, ගමේ මිනිස්සු ඌ දකින විට කතා කරන්නේ. 'කාණසිගාල' කියලා. එක ඇසක් අන්ධ වෙලා තිබුණ නිසා මේ නම පටබැඳිලා තිබුණා.

දවසක් මේ සිවලාට හොඳට ම බඩගිනි හැදිලා ගොදුරු හොයා ගිහින්. කෑමට කිසිම දෙයක් හමුවෙලා නෑ. ඌට බඩගින්න ඉවසා ගන්න ම බැරි වෙලා. මෙහෙම ඉන්න සිවලාට දකින්න ලැබිලා ඉත්තෑවෙක්. උගේ මස් ටිකක් හරි ගන්නට උත්සාහ ගන්න ඕන කියලා හිතලා ඌ අල්ලා ගන්නට ගිහින් ඉත්තෑවා තමාගේ ශරීරය සොලවලා එයින් ඉත්තෑ කූරු සතුරාට එරෙහිව පිටට විදලා. සිවලාගේ එක් ඇහැක එකක් වැදිලා උගේ ඇහැක් අන්ධ වෙලා'යි කියමින් කාණසිගාලයාගේ ඇහැ අන්ධවීමට හේතුවත් ගමේ මිනිසුන් කියන්න පටන්ගෙන තිබුණා.

කුඩා දරුවන් පවා මේ කතාව හොඳින් දැනගෙන හිටියා. මොහුත් කෑම හොයමින් මහ වනයේ ඇවිදිමින් සිටියා. ලොකු පිපාසයක් දැනිලා වැවෙන් වතුර බී එමින් සිටියා. එක් ඇහැක් අන්ධ නිසා පෙනීම තරමක් දුර්වලයි. සතුරකුගේ ප්‍රහාරයකට ලක්වීමට ඇති අවස්ථාවත් වැඩියි. කාණසිගාලයා මෙහෙම යන මාර්ගය අසල සැඟවී ගොදුරු සොයමින් සිටි පිඹුරෙක් දරණ වැලෙන් ඌ වෙළාගත්තා. ගැලවීමට කොපමණ උත්සාහ කළත්, ප්‍රයෝජනයක් වුණේ නෑ. මොහොතින් මොහොත මරණයට ළං වෙමින් සිටියා.

මහකැලෑවට ගිය ගොපල්ලා ගවයින්ට තණ කොළ කවා දහවල් සමයේ ඔවුන්ට ජලය දීම කළ යුතු නිසා වැවට ගෙන එමින් සිටියා. පිඹුරෙක් කාණසිගාලව දරණවැලින් ඔතාගෙන ගොදුරු කරගෙන ඉන්න හැටිත්, ඌ වේදනාවෙන් කෑ ගසන හැටිත් දකින්න ලැබුණා. වහාම අතෙහි තිබුණු පිහියෙන් ලීදණ්ඩක් කපාගෙන පිඹුරාට ගසා සිවලා බේරා ගත්තා. එහෙත් අවාසනාවකට මෙන් සිවලා දරණවැලින් අතහරිනවාත් සමඟ ගොපල්ලාව වෙළා ගත්තා. දැන් සිවලා නිදහස්, ගොපල්ලා පිඹුරාට අසුවෙලා.

සිවලා මෙහෙම කල්පනා කළා . මම නිදහස් වුණා. දැන් මට මෙතැනින් පැන යන්න පුළුවන්. ඒත් මට පැනයන්න මගේ ජීවිතය මට නැවතත් ලබා දුන්නේ මේ මිනිසා. මට කළ උපකාරයට මාත් උපකාර කරන්න ඕන. යැයි හිතලා පිඹුරාගේ ඇඟ මතට වැදිලා ඒ ඒ තැන කඩා කමින්, කෑ ගසා බිය ගන්වමින් ගොපල්ලා නිදහස් කර ගන්න උත්සාහ ගත්තා.

පුංචි ශරීරයක් තිබුණු ඔහුට පිඹුරාගේ ශක්තියත් සමඟ ගැටෙන්න බැරි වුණා. කළ යුතු දෙයක් නැතිව ගියා. ඔහු තමාට කරන්න බැරි කටයුත්ත වෙනත් කෙනකු ලවා හෝ කරවා ගොපල්ලා නිදහස් කර ගන්න හිතුවා. අසල කුඹුරු යායක මිනිසුන් සීඝ

> **සමස්ත සමාජය ම සතුටින් ජීවත්වීමට නම් හොඳ මිතුරන් වගේ ම කෘතගුණ හඳුනන මිනිසුන් තැනිය යුතු වෙනවා. එහි වගකීම් ඇත්තේ අද දවසේ වැඩිහිටි පරපුර නියෝජනය කරන පිරිසට යි.**

සෑම්, වී වැපිරීම් කරන බව දුටුවා. නොපමාව ඌ කුඹුරකට ගොස් ගොවියන්ගේ ඇඳුම්, කෑම් බීම් තබා තිබුණු තැනකට වැදී මිනිසුන්ට පෙනෙන අයුරින් කෑ ගසා ඇඳුමක් අරගෙන කැලෑව දෙසට දුවන්න පටන් ගත්තා. ගොවියොත් මහ හඬින් කෑ ගසා ඌ බිය ගන්වා ඒවා ගැනීමට උත්සාහ කළත් බැරි වුණා. ගල්මුගුරු ගෙන ඌ පස්සේ එළවන්න පටන් ගත්තා. එයිනුත් සිවලා බියට පත් නොවී වස්ත්‍ර අරගෙන ගොපල්ලා සිටි තැනට ම දිව ගොස් ඒ ස්ථානයේ දමා සැඟවී බලා සිටියා. ගොවියන් ඇවිත් බලන විට සිදු වී ඇති විපත දැක්කා. වහාම සියලු දෙනා එකතුවී පිඹුරාගෙන් ගොපල්ලා මුදවාගෙන ගමට ගියා. සිවලාට වුණු විපතත්, ගොපල්ලාට වුණු විපතත් ගම පුරාම ප්‍රසිද්ධ වුණා.

කාණසිවලාට ලොකු ගෞරවයක් දක්වන්න ගොපල්ලාත්, ගමේ මිනිස්සුත් පුරුදු වුණා. ගොපල්ලාගේ සහ කාණසිවලාගේ මිතුරුකම දිනෙන් දින වර්ධනය වුණා. එයට හේතුව වුණේ දෙදෙනා ම මහ වනයේ දී හමුවන නිසා. තිරිසනුන් පවා උපකාර කළ අයට උපකාර කරන බව මේ කතා පුවතින් පෙන්වා දෙනවා.

සත්ව ලෝකයේ මෙවැනි සිදුවීම් අපමණ ව සිදු වෙනවා. මනුෂ්‍ය ලෝකයේත් උපකාර කළ අයට උපකාර කිරීමේ පුවත් හමුවෙනවා. එහෙත් වර්තමාන සමාජයේ එවැනි සිදුවීම් හමුවන්නේ කළාතුරකින්. ආත්මාර්ථය මතුවී පරාර්ථකාමී බව නැතිවී යාම මෙයට හේතුවයි.

යමෙක් තමාට උපකාර කළ මිතුරා සමීපයේ නො සිටියත් බොහෝ කල් නොදැක්කත්, මාගේ මිතුරා නිදුක් වේවා, නීරෝගී වේවා, සුවපත් වේවා කියා මෛත්‍රී කිරීම හෝ කරන්නේ නම් එයත් ප්‍රත්‍යුපකාර ගණයට අයත් වෙනවා. එවැනි පුද්ගලයින්ගේ කීර්තිය දිනෙන් දින පැතිර යනවා. මිනිසුන්ට සහ දෙවියන්ට ප්‍රිය වෙනවා. මේ නිසා ම බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රයේ දී උපකාරක, අත්ථක්ඛායී, සමාන සුඛදුක්ඛ, අනුකම්පක යන හොඳ මිතුරන් ඇසුරු කිරීමටත්, අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපාය සහාය යන මිත්‍ර ප්‍රතිරූපකයින් ඇසුරු නො කිරීමටත් ධර්මාවවාද ලබා දී තිබෙනවා.

සමස්ත සමාජය ම සතුටින් ජීවත්වීමට නම් හොඳ මිතුරන් වගේ ම කෘතගුණ හඳුනන මිනිසුන් තැනිය යුතු වෙනවා. එහි වගකීම් ඇත්තේ අද දවසේ වැඩිහිටි පරපුර නියෝජනය කරන පිරිසට යි. එසේ නොවන විට ධනය, තනතුරු, උගත්කම්, කුලය, උසස් පහත්, මධ්‍යම බව ආදිය හේතු කරගෙන කිසිකෙනෙක් අන් අය ගැන නොතකා අහංකාරයෙන් ජීවත්වීමට පටන් ගන්නවා. එවැනි අයට දුකක්, කරදරයක් පැමිණියා ම වචනයකින්වත් සිත් සැනසීමට හෝ කෙනකු නැති වෙනවා. තමා තමාට ම දොස් පවරා ගන්නවා, කම්පාවට පත් වෙනවා. ජීවිත හානි පවා සිදු කර ගන්නවා. එම තත්ත්වයට පත් නොවීමට නම් ප්‍රත්‍යුපකාර ගුණය රකිමින් මිතුරුදම් පවත්වා ගැනීම වැදගත් වෙනවා. මිතුරුකම් පැවැත්වීමට හෝ කෘතගුණ සැලකීම්වලට ආගම, ජාතිය, ස්ත්‍රී පුරුෂ භේදය, ප්‍රදේශය හෝ රට, එසේ නොවේ නම් වෙනත් විවිධ ගැළපීම් බාධාවක් කර ගන්න එපා.





# සොරකුගේ පාපොච්චාරණය

**අතීතයේ සිංහල දීපයේ එක් භික්ෂුන් වහන්සේ නමක් වැඩ වාසය කළා. උන්වහන්සේ ඉතා දුෂ්කර වනයක පිණ්ඩපාතයේ යෙදෙමින්, බණ භාවනා කරමින් ගල්ලෙනක වැඩ විසූ සේක.**

දිනක් සොරුන් පන්සියයක් ඒ ලෙන අසලින් යන විට සොර නායකයා මේ භික්ෂුන් වහන්සේ දුටුවා. එතැනට පැමිණ ඔහු මෙසේ අසා සිටියා.

"ස්වාමින් වහන්ස, මේ දුෂ්කර ගල් ලෙනේ ඔබ වහන්සේ වැඩ වාසය කිරීමට පැමිණ දැන් කොතරම් කාලයක් වෙනව ද?"

"පින්වත, මම අවුරුදු හයක් පුරාවට මෙහි සිල් රකිමින් ධර්මානුකූලව වැඩ වාසය කරනවා."

"ස්වාමීනි, දෙවැන්නෙක් හෝ නැතිව තනිවම වාසය කරන ඔබ වහන්සේ මේ අවුරුදු හය තුළ දී කිසියම් ධ්‍යානයක් සමාපත්තියක් හෝ අභිඥාවක් උපදවා ගත්තේ ද ?"

"පින්වත, මම එවැනි කිසිදු විශේෂ දෙයක් ලබා නැහැ. නමුත් මම ශීලය රකිමින්, විවේකීව, ධර්මය පුරුදු කරමින් වැඩ වාසය කරනවා.

"ස්වාමිනි, සිල් රැකීමෙන් පමණක් මේ බුද්ධ ශාසනය සම්පූර්ණ වන්නේ නැහැ. නිකලෙස් වීම පිණිස උත්සාහවත් වනු මැන

"පින්වත ඔබ එවැනි දෙයක් මට කියන්නේ මන්ද?"

"ස්වාමීනි, මීට කාලයකට පෙර මම ද පැවිදි වී සිටියා. මම වැඩ වාසය කළේ ද මේ ලෙනෙහි ම යි. මම අභිඥාවෙන් පරතෙරට ගියා. දිවැස ලබා ගත්තා. ඍද්ධිය ලැබුවා. පෙර විසූ ආත්ම දුටුවා.අනුන්ගේ සිත් දුටුවා. එසේ අභිඥාලාභී වූ මම ඒවාට ඇලී රහත් ඵලය ලබා ගැනීම ප්‍රමාද කළා.

"ස්වාමීනි එක් දිනක් සවස් කාලයේ මම භාවනාවෙන් නැඟිට ලෙනෙහි දොර අබියසට ගියා. එහිදී මා දුටුවා අලංකාරව සැරසුණු රූමත් ගොපලු දැරියක්. ඇය දුටු විට එකවර ම මාගේ සිතට රාගය උපන්නා.ඒ රාග සිත මා මුළාවට පත් කළා. රාග සිත නිසා ම මම උපැවිදි වී ඒ දැරිය සොයා ගෙන ගමට ගියා. එහෙත් ජීවත්වීමට රැකියාවක් තිබුණේ නෑ. ඒ නිසා මම සොරකමට පුරුදු වුණා. කාලයක් යද්දී මා සුරවීර දක්ෂ සොරෙක් වුණා. මා හට තවත් පනස් දෙනෙක් විටින් විට එකතු වුණා.දිනක් අප සියලු දෙනාම අර දැරිවියගේ නිවස වටකොට බලහත්කාරයෙන් ඇය පැහැරගෙන ගියා. එදා සිට මා බොහෝ පව් කර ගත්තා. නිරයේ මහා දුකක් විඳීමට මට තිබෙන බව මම දන්නවා.මම අහිංසක මිනිසුන් උපයන ධනය ඔවුන් තලා පෙලා පැහැර ගන්නවා. නමුත් මට මේ කාමයන්ගේ ඇති වීමක් නෑ. පෙරදී මා රැස් කළ යම් දෙයක් ඇත්නම් මේ කාමය නිසා ඒ සියලු දේ විනාශ වුණා. ස්වාමීනි ධ්‍යාන අභිඥා සමාපත්තිහු හුදෙක් කෙලෙස් සමනය වීම පමණක් ම පවතී. මාගේ කතාව අසා ඔබ වහන්සේ සංවේගය උපදවා ගනු මැන.හිතට වසඟ වන සියලු දෙනාම ප්‍රමාදයට පත් වේ. එයින් විනාශ වෙයි. බොහෝ දුක් අනුභව කිරීමට සිදුවේ. වේගයෙන් ඔබ වහන්සේගේ ආයුෂ ගෙවී යයි. සද්ධර්මය පිරිහී යයි . ඒ නිසා වහවහා සංවේගය උපදවා නිකෙලෙස් වීමට වීර්ය කරනු මැන.

සොරාගේ වදන් ඇසූ භික්ෂුන් වහන්සේ සසර බිය වටහාගෙන වහ වහා වීර්ය කොට සුළු කලකින් රහත් බවට පත්වූ සේක. ඒ බව දැන ගත් සොර නායකයා උන්වහන්සේ වැඩ සිටි ගල්ලෙන අසල ප්‍රාසාදයක් කරවූවා. එසේ ශාන්ත භාවයට පත් වූ, හැම දෙයින් ම නිදහස් වූ ඒ තෙරුන් වහන්සේ දෙවියන් බඹුන් සහිත ලෝකයා ගේ නමස්කාරයට පාත්‍ර වුණා.

එනිසා අප ද සිල් රැකීම හෝ ධර්මය උගත් පමණින් කෙලෙස් දුරු වීමක් සිදු වේ යැයි සිතීම මුළාවකි.අභිඥාලාභීන් ගේ සිත් පවා කාමය නිසා අපිරිසුදු වෙයි. මෙය පෘථග්ජන දෝෂයකි. හිස් පෘථග්ජනයන් ගැන සිතීම පවා මහා බියක් උපදවයි.

# ආදර්ශය උතුම් ය

**එදා ලක්දිව කෝරණක විහාරවාසී නමින් මහ තෙරුන් වහන්සේ නමක් පැවිදි වී රුහුණු පුරවරයේ වැඩසිටියා. උන්වහන්සේගේ සොහොයුරියගේ පුතාද තෙරුන් වහන්සේ ළඟ පැවිදි ව වෙනත් ප්‍රදේශයක ඉගෙනීම් කටයුතු කළා.**

බොහෝ කාලයක් මේ කුඩා තෙරුන් වහන්සේ තම මව්පියන් දැක තිබුණේ නැහැ. ඒ මවගේ ඉල්ලීමට මහා තෙරුන් වහන්සේ, කුඩා තෙරුන් වහන්සේ රුහුණු පුරයට පිටත් කිරීමට සිතා උන්වහන්සේ වැඩ සිටි ප්‍රදේශය බලා පිටත් වුණා.

ශිෂ්‍ය තෙරුන් වහන්සේ ගුරු හිමියන් බැහැදැකීමට රුහුණ බලා වැඩියා. ගුරු ශිෂ්‍ය දෙන ම මහවැලි ගඟ අසල දී මුණ ගැසුනා. ශිෂ්‍ය තෙරුන් වහන්සේ ගසක් මුල වැඩ සිටි මහ තෙරුන් වහන්සේට වන්දනා කළා.

ඔබගේ මව නිතර ම ඔබ ගැන විමසයි. කලෙකින් නොදුටු බව කියයි.

එනිසා මෙම වස් කාලය ගමට ගොස් එහි වස් වසන්න කියා ශිෂ්‍ය තෙරුන් වහන්සේ රුහුණු පුරයට පිටත් කළා. ඒ තෙරුන් වහන්සේ රුහුණු පුරයේ පිහිටි විහාරස්ථානයට වැඩම කළා. වස් සමාදන් වන දිනයේ ඒ තෙරුන් වහන්සේ ගේ පියා විහාරස්ථානයට පැමිණ භික්ෂුන් වහන්සේලාට වන්දනා කොට පවසා සිටියා.

"ස්වාමින් වහන්ස, මම ඉඩම මායිමේ තාවකාලික කුටියක් ඉදිකළා. මට එහි වස් සමාදන් කරවීමට ලබා දෙන තෙරුන් වහන්සේ කවුද?"

"උපාසකය ඔබට ආගන්තුක භික්ෂුවක් ඒ සඳහා ලබා දෙන්නම්

එම කුටියට තෙරුන් වහන්සේ වැඩම කළා. උපාසකතුමා උන්වහන්සේට වන්දනා කරමින් මෙසේ කියා සිටියා

"ස්වාමීනි මෙම වස් වසන කාලය තුළදී අපට අනුකම්පා කර මාගේ නිවසෙන් පමණක් දන් වළඳන්න. වස් පවාරණය වූ පසු අපට දන්වා පිටත්වන්න. කියා ඉල්ලීමක් කළා .

මව්පියන්ට අනුකම්පා පිණිස ඒ තෙරුන් වහන්සේ ඒ ඉල්ලීම පිළිගත්තා. එදා සිට ඒ උපාසිකාව ප්‍රණීත ආහාර උයා දානය පූජා කරනවා. උන්වහන්සේ පින් අනුමෝදන් කොට පිටත් වෙනවා.

මේ වැඩ වාසය කරන්නේ තමන්ගේ පුත්‍ර රත්නය බව ඒ මහලු මවුපියෝ හඳුනා ගත්තේ නැහැ. වස් අවසානයේ දී යන බව දැන්වූ විට මනාව සැකසූ සිවුරක් ද, උක් සකුරු ද පූජා කර ගත්තා. මව්පියන්ට අනුකම්පාවෙන් අනුමෝදනා බණ වදාළා. ඉන් පිටත්ව නැවත වඩින උන්වහන්සේට ආචාර්යයන් වහන්සේ පෙර ස්ථානයේදී ම හමුවුණා.

ආයුෂ්මතුනි වස් කාලය සුව සේ විසුවද? උපාසිකාවන්ට ධර්මයෙන් අනුග්‍රහ කළා ද?

එසේ ය ස්වාමීනි, සුවසේ වාසය කළා. මව්පියන්ටත් ධර්මයෙන් අනුශාසනා කළා. ස්වාමිනී මාගේ මවුපියන් පූජා කළ මේ සිවුර මම ඔබ වහන්සේට පූජා කරනවා කියා සිවුර පූජා කොට නැවත වැඩ සිටි ගම බලා පිටත් වුණා.

පසුදා මහා තෙරුන් වහන්සේ නැවත වැඩ සිටි රුහුණට වැඩියා. උපාසිකාව මඟ බලාගෙන සිටියේ තම පුත්‍රයා ව උන්වහන්සේ කැඳවාගෙන එන තුරු. නමුත් තනිව එනු දැක කම්පාවට පත්ව


"අනේ ස්වාමීනි, මාගේ පුත්‍රයාට යම් කරදරයක් වත්ද, ඔබ වහන්සේ කැඳවා ගෙන නාවේ මන්ද?" යනුවෙන් මහා හඬින් වැළපෙන්නට පටන් ගත්තා. එවිට තෙරුන් වහන්සේ උපාසිකාව සනසා ඔවුන් දුන් වස්ත්‍රය ද පෙන්වා පවසා සිටිනවා මේ තුන් මස වස් විසුවේ තමන්ගේ පුත්‍රයා බව.

උපාසිකාව පුත්‍රයාගේ අල්පේච්ඡතාව ගැන පැහැදී පුත්‍රයා වැඩි දෙසට මුණින් වැටී වන්දනා කරමින්

"මාගේ පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ දෙසූ ධර්මය ඒකාන්තයෙන් ම ආරක්ෂා කරයි. උන්වහන්සේ ධර්මය වදාළේ මාගේ පුත්‍ර රත්නය වැනි භික්ෂුන් වහන්සේ අරභයා යි. තුන් මසක් වැඩ වාසය කළ ද තුන්මසක් දානය අනුභව කළ ද, මම පුතා වෙමි. ඔබ මාගේ මෑණියෝ ය" කියා නො පැවසූ මගේ ඒ උතුම් පුත්‍ර රත්නයට නමස්කාර වේවා කියමින් ඈ නමස්කාර කළා.

මහාවිශුද්ධි මාර්ගය ඇසුරිනි.

නයනා නිල්මිණී



# බුදුහාමුදුරුවෝ වදාළ ධර්ම මාර්ගයේ අරමුණක් ඇතිව ගමන් කළ යුතුයි




උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ
කෑගල්ල ඔලගන්කන්ද සාම විහාරය, තටාක පාර විවේක සේනාසනය, මිරිහැල්ල සම්බෝධි ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය යන විහාරයන්හි අධිපති විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ පරියාප්ති ශාසනසේවා කීර්ති ශ්‍රී සිරි සීලවිමල ධම්මානන්ද වංශාවතංස සද්ධර්ම කීර්ති ශ්‍රී පටිපත්ති සෝභන මහා විහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ශාස්ත්‍රපති

## දීවෙල මහින්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය

**අග්‍රගණ්‍ය පාණ්ඩිත්‍යයකින් පිරිපුන් ධර්මවිනයධර බහුශ්‍රැත ස්වාමීන් වහන්සේ නමක් වශයෙන් ප්‍රකට ඔබ වහන්සේ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අනුනායක ස්වාමීන් වහන්සේ වශයෙන් ප්‍රිය සම්භාවනීය විශිෂ්ට සේවාවක් සිදුකරනු ලබනවා. මේතරම් සාර්ථක පැවිදි ජීවිතය-කට පසුබිම සකස් වුණේ කොහොමද අපේ හාමුදුරුවනේ.**

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සතර කෝරළයට අයිති රමණීය කඳු වළල්ලකින් වටවුණු ස්වභාව සෞන්දර්යයෙන් අනූන දීවෙල ග්‍රාමයේ දී තමයි මම ජන්මලාභය ලැබුවේ. ඒ 1949 වර්ෂයේ ජුනි මස 13 වැනි දින සහෝදර සහෝදරියන් පස්දෙනකුගෙන් යුතු පවුලේ පස්වෙනියා වශයෙන් මගේ උප්පත්තිය සිදුවුණා. මගේ මව්පියන් බොහොම ගුණගරුක, ශ්‍රද්ධාවන්ත, ගුණවන්ත දෙපළක් නිසාම ඒ සැදැහැවත් මව්පියන්ගෙන් ලැබුණු ශාසනික උරුමයත් සංසාරයෙන් පුරණ ලද පාරමිතා බල මහිමියේ පුණ්‍ය ශක්තියත් හේතුවෙන් කුඩා කාලයේ සිටම පැවිදිවීමේ ආසාවක් තිබුණා. කෑ/දීවෙල මහා විද්‍යාලයේ 9 වැනි ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ කාල පරිච්ඡේදයේ දී ම පූර්වෝපචිත පුණ්‍ය ශක්තියට අනුව උත්තරීතර පැවිදි ජීවිතයට පත්වීමේ පින්බර අවස්ථාව උදාවුණා. ඒ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය ආරම්භ කර වසර 100 ක් පිරීම නිමිති කරගෙන කුල දරුවන් 500 ක් පැවිදි කිරීමේ පුණ්‍ය මහෝත්සවයේ දී ප්‍රවීණාචාර්ය කම්මට්ඨානාචාර්ය පූජ්‍ය දීවෙල ධම්මානන්ද හිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1964 වර්ෂයේ දී දෙසැම්බර් මස 20 වැනි දින දීවෙල මහින්ද යන උත්තරීතර ශාසනික නාමයෙන් උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ පැවිදි බව ලබා ගත්තා. කෑ/දීවෙල ශ්‍රී බෝධිරාජ පරිවේණස්ථානය තුළ වසර 2 ක කාලයක් පැවිදි දිවියට ඇවැසි මූලික බණ දහම් පුහුණු කර ගැනීමෙන් අනතුරුව කු/ශ්‍රී විජයානන්ද පිරිවෙනින් ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගත්තා. ඒ වගේම කොළඹ ජේතවන විශ්ව විද්‍යාල පිරිවෙන, කෑ/මහින්දෝදය විද්‍යායතන පිරිවෙන යන දීප්තිමත් පරිවේණස්ථානයන්හි වැඩ සිටි ධර්මධර විනයධර ශ්‍රද්ධා සම්පන්න ආදර්ශවත් සංඝ නේතෘන් වහන්සේ යටතේ ශාස්ත්‍රෝන්නතිකාමීත්වයෙන් අධ්‍යාපන කටයුතු සිදුකරමින් කුසලතා සහතිකයක් සහිතව උසස් පෙළ විභාගය සමත් වුණා.

මූලික වශයෙන් අනුරාධපුර බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය තුළින් පස් අවුරුදු පාඨමාලාවක් හදාරමින් ත්‍රිපිටකවේදී උපාධිය ලබා ගත්තා. ඉන්පසුව පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, කොළඹ විශ්ව විද්‍යාලයෙන්, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවත්, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියත් ලබා ගත්තා. ප්‍රතිබලසම්පන්න ව්‍යක්ත විශාරද යතීන්ද්‍රයන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පිළිපදිමින් චිරාගත සම්ප්‍රදායන් පූර්වාදර්ශකොට ගනිමින් බුද්ධ දේශනාවේ සඳහන් සංඝ සෝභන ගුණයන් වඩාත් වර්ධනය කර ගනිමින් කටයුතු කිරීම නිසා පැවිදි ජීවිතය සාර්ථක කර ගැනීමට හැකි වුණ බවත් කෘතවේදීව සිහිපත් කළ යුතුයි.




**ශාසනභාරධාරී මහ තෙරනමක් වශයෙන් කටයුතු කරන ඔබ වහන්සේ සිදුකරන ජාතික ආගමික ශාසනික අධ්‍යාපනික සේවය ඉතා කෙටියෙන් සඳහන් කරනවා නම්, නායක හාමුදුරුවනේ,**

නිකායේ පරිපාලන ව්‍යුහයේ මූලික ඒකකය වන්නේ ප්‍රාදේශීය සංඝ සභාවයි. 1972 වර්ෂයේ දී කෑගල්ල ප්‍රාදේශීය සංඝ සභාවේ සාමාජිකත්වය ලබාගෙන 1995 වර්ෂයේ සිට 1998 වර්ෂය දක්වා සංඝ සභාවේ ලේකම් ලෙස විශාල කාර්යභාරයක් ඉටු කළා. 2000 වර්ෂයේ සිට දිසාපාලක, 1993 වර්ෂයේ සිට ජෙට්ඨානුවිජ්ජක, 2007 වර්ෂයේ සිට කාරක සභික, පටිපත්ති සංවර්ධන සභාවේ ලේඛකාධිකාරී වශයෙන් විවිධ වගකීම් දරමින් ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරමින් සිටි කාල පරිච්ඡේදයේ දී ම 2018 වර්ෂයේ අතිපූජ්‍ය අනුනායක ධුරයට පත්කර ගැනීමටත් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ කාරක පාලක සංඝ සභාවේ අනුමැතියෙන් "සිරි සීලවිමල ධම්මානන්ද වංශාවතංස සද්ධර්ම කීර්ති ශ්‍රී පටිපත්ති සෝභන" යන ගෞරව නාමයෙන් සම්භාවනාවට පාත්‍රකිරීමටත් කටයුතු කළා.

නිකායේ කටයුතු වෙනුවෙන් සිදුකළ සේවය වගේම ධර්ම ශාස්ත්‍රීය සේවය සිදුකරමින් සෑම අවස්ථාවක දී ම උතුම් සම්මාසම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය අභිවෘද්ධිය පිණිස විශාල කාර්යභාරයක් සිදුකරගෙන ගිය බවත් සිහිපත් කිරීම වැදගත්. ඒ අනුව කෑ/දීවෙල බෝධිරාජ පිරිවෙන, කු / වෙහෙරපිටිය විද්‍යාර්ථෝදය පිරිවෙන, කෑ / විද්‍යාමංගල පිරිවෙන යන දීප්තිමත් පරිවේණස්ථානවල පරිවේණාචාර්යවරයකු වශයෙන් සේවය කළ කාලය තුළ 1987 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යංශයේ පාඨමාලා සම්පාදකවරයකු වශයෙන් සේවයට බැඳුණා. අනතුරුව පිරිවෙන් පරීක්ෂකවරයකු ලෙස සේවය කරමින් කළුතර, ඌව පළාත්වලින් කුරුණෑගල ගාල්ල යන දිස්ත්‍රික්කවලත් පිරිවෙන් අධීක්ෂණ කටයුතු භාරව කටයුතු කළා.

1992 වර්ෂයේ සිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට සම්බන්ධ වෙමින් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරුවල රාජකාරි කළා. මේ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ රැඳී සිටිමින්, ඌව සබරගමුව, දකුණ, මධ්‍යම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරමින් අවසානයේ දී ජාතික පිරිවෙන් උපදේශක ලෙස 2009 වර්ෂයේ දී විශ්‍රාම ගන්නා තෙක් ධර්ම ශාස්ත්‍රීය සේවයෙහි නියැළුණා. ඒ ඒ පරිවේණස්ථානවල වැඩ සිටි සර්වභෞම පාණ්ඩිත්‍යයෙන් සංඝ සෝභන ගුණාංගයන්ගෙන් පිරිපුන් සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේලාගේ නොමඳ සහයෝගයෙන් ශික්ෂාකාමී සඟ පරපුරක් සම්බුද්ධ ශාසනයට දායාද කිරීමට කටයුතු කළා. එම ශාසනික සේවාව ඇගයීමට පාත්‍ර කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ශ්‍රී පරියාප්ති ශාසන සේවා කීර්ති ශ්‍රී යන ගෞරව නාමය පිරිනැමීමට කටයුතු කළා.

සමාජසේවා හැකි ආකාරයෙන් සිදුකළා. ඔලගන්කන්ද ජල යෝජන ක්‍රමය යටතේ ආසියානු සංවර්ධන බැංකු ආධාර හරහා ගමට වතුර ටැංකි ලබා ගැනීමට කටයුතු කළා. ඒ තුළින් ඔලගන්කන්ද ප්‍රදේශයේ උග්‍ර ජල හිඟයෙන් පීඩා විඳින අවට ගම්වලටත් සහනයක් ලබා ගැනීමට හැකිවුණා. වැසී තිබුණ ඔලගන්කන්ද ප්‍රාථමික විද්‍යාලය නැවත ආරම්භ කිරීමට මුල් වුණා. වර්තමානය වන විට ඔලගන්කන්ද පාසල ප්‍රදේශයේ ජනප්‍රිය පාසල බවට පත්වී තිබෙනවා. සුචරිතවත් දරු පිරිසක් නිර්මාණය කර ගැනීම උදෙසා කෑ/ධර්මවිජය දහම් පාසල සංවර්ධනයට කටයුතු කළා. ප්‍රදේශයට විදුලිබලය දුරකතන පහසුකම් ලබා ගැනීමටත්, ප්‍රදේශයේ පාරවල් කාපට් අතුරමින් වැඩි දියුණු කර ගැනීමටත් කටයුතු කරන අතරතුර ගමේ සියලුම සංවිධානවල අනුශාසකත්වය දරමින් අවශ්‍ය අනුශාසනා ලබා දෙමින් ප්‍රදේශයේ අභිවෘද්ධිය පිණිස කටයුතු කර ගෙන යනවා.

**විචක්ෂණ බුද්ධියෙන් පරිණත අද්දැකීම්වලින් පිරිපුන් සුපේශල ශික්ෂාකාමී ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වශයෙන් හැදෙන වැඩෙන අපේ පුංචි හාමුදුරුවන් වහන්සේලාට ලබා දෙන්නේ මොනවගේ අනුශාසනාවක් ද?**

බුදුරජාණන් වහන්සේ තමයි අපේ ශාස්තෘවරයාණන් වහන්සේ. බුදුහාමුදුරුවන් අනුදැන වදාළ ප්‍රතිපත්ති මාර්ගය අපි අනුගමනය කරගෙන යනවානම්, බොහොම වාසනාවන්ත පැවිදි ජීවිතයක් බවට පත්කර ගැනීමට අවස්ථාව තිබෙනවා. ගතයි සිතයි දෙකම පැවිදි කරගෙන බුදුහාමුදුරුවෝ වදාළ ධර්ම මාර්ගයේ අරමුණක් ඇතිව ගමන් කරනවා නම් ප්‍රශ්නවලට, ගැටලුවලට අපේ භික්ෂූන් වහන්සේ ට මුහුණ දෙන්න වෙන්නේ නැහැ.

හේමමාලා රන්දුනු

**උදකං හි නයන්ති නෙත්තිකා**
**උසුකාරා නමයන්ති තෙජනං**
**දාරුං නමයන්ති තච්ඡකා**
**අත්තානං දමයන්ති පණ්ඩිතා**

# පින් ඇත්තෝ ම බුහුමන් ලබති

ජලයෙන් ප්‍රයෝජන ගන්නෝ තමන් කැමැති තැනකට දිය ගෙන යති. ලෝහයෙන් වැඩ කරන්නෝ තමන්ට අවශ්‍ය පරිදි යකඩ නැමීම් කරති. ඇද ඇරීම් කරති.

ලීයෙන් වැඩ කරන්නෝ තමන් කැමැති ලෙසට දැව දඬු නැමීම්, ඇද හැරීම් කෙරෙති. එහෙත් මේ එකකටවත් සිතක් නැත. එසේ වුව ද ඔවුහු කැමැති පරිදි මේවා කීකරු කොට බොහෝ පල ප්‍රයෝජන ලබති. එසේම පණ්ඩිතයා අකීකරු තම සිත දමනය කොට කෙලෙස් වනසා බොහෝ පල ලබන්නේ ම ය.

මෙහි එන උපමාවන් තුන ම අජීවක ය. සංඥ රහිත වස්තූන් ය. එහෙත් දක්ෂයකුහට, විධිමත් ව ශිල්ප හැදෑරීම් කළ කෙනකු ට ඒ වා හමුවූයේ නම් තමාට ප්‍රයෝජන සහිත කර ගැනීමට සමත් වේ. සුජීවත් සවිඤ්ඤාණ සෑම මිනිසකුට ම ක්‍රියාකාරී සිතක් වේ. එහෙත් ඒ සිත තමන්ට ඕනෑ පරිදි යහපත් සිතක් කර ගත හැකි වන්නේ පණ්ඩිතයාට පමණක් බව ය මේ බුද්ධ වචනයෙන් දේශනා කොට ඇත්තේ.

එක් අවස්ථාවක කාශ්‍යප බුදුරජාණන් වහන්සේ විසි දහසක් මහ රහතන් වහන්සේ පිරිවරා බරණැස් නුවරට වැඩියහ. ඒ නුවර වැසියෝ අට දෙනා, දස දෙනා වශයෙන් එකතුව දානය පිළිගැන්වූහ. බුදුරජාණන් වහන්සේ අනුමෝදනා බණ දේශනා කළහ. එහිදී, ඇතැම් කෙනෙක් අනුන් සහභාගි කර නොගෙන තමන් සතු දෙයම දී උපනූපන් තැන භෝග සම්පත්තිය පමණක් ලබති. පිරිවර සම්පත් නොලබති.

තවත් කෙනෙක් අනුන් ලවා දෙනු ලබයි. තමන් නොදෙයි. ඔහුට පිරිවර සැප ලැබෙයි. එහෙත් භෝග සම්පත් ලද නොහැකි ය.

තව කෙනෙක් තමන් ද නොදෙයි. අනුන් ලවා ද නොදෙයි. ඔහුට සම්පත් දෙකම නැත. උපනූපන් තැන සිඟන්නෙක් ව උපදියි.

මේ අතර තවත් කෙනෙක් තමා ද දෙයි. අනුන් ලවා ද දෙයි. ඔහුට ගිය ගිය තැන භෝග සම්පත් ලැබේ. පිරිස් සම්පත් ද ලැබේ'යි උන්වහන්සේ දේශනා කොට වදාළහ.

මේ බණ අසා සිටි නුවණැති මිනිසෙක් මම මේ හැම සැපතක් ම ලබමි'යි සිතුවේ ය. බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ ඒ සියලු භික්ෂූන් වහන්සේට දානයට ආරාධනා කොට සිටියේ ය.

වහ වහා තම ගම් බලා පිටත්ව ගෙන් ගෙට ගොස් පින්වතුනි, හෙට දින විසිදහසක් භික්ෂූන් වහන්සේ සමඟ අපගේ නිවසට දානයට වඩින ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළා. ඔබ ද හැකි පමණින් දන් පිළියෙළ කරගෙන පැමිණෙන්න යි දැන්වීය. එම නිවැසියෝ ද තමන් ඉතා  දිළිඳු වුව ද අප දහයකට , අපි විස්සකට ය, ආදි වශයෙන් හැකි පමණින් බාර ගත්හ.

මේ ගමේ "මහදිළින්දා" නම් ඉතා දිළින්දකු විය. උපාසක තෙමේ ඔහුට ද දානය සිහිපත් කර කුමක් හෝ පූජා කරන ලෙස දැන්වීය.

"මා ගමේ බලවත් ම දුගියා බව ඔබ නොදනී ද? හෙට උදේ කැඳ උගුරක් හෝ බොන්නට හාල් ඇටයක් ගෙයි නෑ"යි ඔහු කීවේ ය.


"යහළුව අපේ ගමේ මිනිසුන් දෙස බලන්න. ඔබ දෙස බලන්න. පෙර ජාතිවලදී ඔබ මෙවැනි පින් නොකළ නිසා මේ වෙනස නොපෙනේ ද?" යි ආරාධිත උපාසක තෙමේ මහ දිළින්දාට කරුණු කීය.

මහ දිළින්දා එයින් සංවේදී විය. තමන්ටත් එක් නමක් දෙන්න යැයි උපාසකගේ බිරිඳට ඒ බව පවසන්නේ ඇය ද ඉතා සතුටු විය. දිළින්දා සිටු ගෙදරට ගියේ ය. ඒ සිටුතුමා තුන්දහස් නමකට දන් භාරගෙන තිබුණි. ඔහුට දර පලා දී හාල් නැලි අටක් ලබා ගත්තේ ය. බිරිඳ සිටු දේවියට හාල් තුනපහ කොටා දී ගිතෙල් තුනපහ ආදිය ද ලැබීමෙන් දානයට සූදානම් විය.

අඹුව මැල්ලුමට පලා මිටියක් ගෙන එන්න යැයි කී විට ඔහු වෙළෙඳ පොළේ පලා නොදැක ගං ඉවුරෙහි පලා කඩන්නට ගියේ, දන්දීමේ සතුට මහ හඬින් කියන්නට විය . ගඟේ මසුන් මරමින් සිටියකු ඔහු හඳුනාගෙන තොරතුරු දැනගෙන මසුන් වැල් සකසා දී අලෙවි කොට මසුන් හිමිකරු දුන් මාළු ටික දානයට ගෙන ගියේ ය.

මෙදින උදෑසන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ ලොව බලා වදාරණ සේක. ඊයේ සිට තම බිරිඳත් සමඟ එක්ව එක් නමකට දන් දීමට දිළිඳු ඔවුන් වෙහෙසෙන අයුරු දැක ඒ දානය තමන් වහන්සේ පිළිගැනීමට අදිටන් කළ සේක. මේ සියලු සිදුවීම් දුටු සක්දෙවිඳු දිළින්දාගේ ගෙදරට කුලීකරුවකු ලෙස ආවේ ය. දිව්‍ය රස බොජුන් පිළියෙළ කළේ අරක්කැමියා ලෙස ය.දන් වේලාවට දුගියා විහාරයට ගියේ ය. තමාට කැප කළ භික්ෂූන් වහන්සේ දෙන ලෙස උපාසකට කීවේ ය. එහෙත් සටහන අනුව ඒ වන විට  සියලු ආරාධිතයින් ඒ ඒ ගෙට වැඩමවා අවසන් වී සිටියහ. ඉතිරිව සිටියේ බුදුරජාණන් වහන්සේ පමණි. උපාසක තෙමේ සමාව අයැද රජවරු ඇමැතිවරු බුදුරජාණන් වහන්සේගේ පාත්‍රය ගැනීමට පසුවෙති. ඔබ එහි ගොස් කරුණු කියා වැඳ පාත්‍රය ලබා ගන්නා ලෙස ඉල්ලා සිටියේ ය. එසේ විය. බුදුරජාණන් වහන්සේ සිඟන්නා අතට දුන් පාත්‍රය රජුට වුව ද උදුරා ගත නොහැක. දුගියාගේ ගෙය ඉතා මිටි ය. බුදුවරු නොනැමී පිවිසීම සිරිත ය. මහපොළොව යටට ගිලා බසිද්දී, බුදුරදුන් ගෙට වඩිද්දී රජ

ජලයෙන් ප්‍රයෝජන ගන්නෝ තමන් කැමැති තැනකට දිය ගෙන යති. ලෝහයෙන් වැඩ කරන්නෝ තමන්ට අවශ්‍ය පරිදි යකඩ නැමීම් කරති. ඇද ඇරීම් කරති. ලීයෙන් වැඩ කරන්නෝ තමන් කැමැති ලෙසට දැව දඬු නැමීම්, ඇද හැරීම් කෙරෙති. එහෙත් මේ එකකටවත් සිතක් නැත. එසේ වුව ද ඔවුහු කැමැති පරිදි මේවා කීකරු කොට බොහෝ පල ප්‍රයෝජන ලබති. එසේම පණ්ඩිතයා අකීකරු තම සිත දමනය කොට කෙලෙස් වනසා බොහෝ පල ලබන්නේ ම ය.



මැතිවරුන් ද පසු පසින් ආයේ අසාර්ථක දානයෙන් පසු බුදුරජාණන් වහන්සේ රජගෙට වැඩමවා වැළැඳවීමට ය. දානය පිරික්සූ ඔවුහු රජ ගෙදරවත් නැති දානය දැක යන්නට ගියහ. වළඳා අවසන බුදුරජාණන් වහන්සේ අනුමෝදනා බණ දේශනා කොට ආපසු වැඩියහ. දුගියා පාත්‍රය ගෙන ටික දුරක් පසු පස ගියේ ය. නිවෙසේ සිටි සක් දෙව් උඩ බැලුවේ ය. මුළු ගෙයම සත් රුවන් පිරී ගියේ ය. දුගී බිරිඳ දරුවන් ද ගෙන පාරට බැස සිටිය දී ආපසු ආ දුගියා සත්රුවන් දැක සතුටු විය. ගැල් දහසක් ඉල්ලමින් රජුවෙත ගොස් කරුණු කියද්දී මහජනයා විමසා ඔහු සිටු තනතුරකට පත් කළේ ය. ඉතිරි කාලය ද පින් කරමින් සිටි ඔහු බුද්ධාන්තරයක් ම දෙව් සැප වින්දේ ය.

*ඉතිරි කොටස 09 පිටුවට ....*

ත්‍රිපිටක පරිවර්තන
මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු
දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**

08 පිටුවෙන් ....

ගෞතම බුදුරජාණන් වහන්සේගේ දවස සැරියුත් තෙරුන්ගේ හිතවත් සිටු ගෙදරක ඉපදුණි. කුසයේ සිටි කාලයේ දී ම හත්වරක් දන් දී ඇත. සැරියුත් තෙරුන් නිවසට ආ දිනක සිටු කුමරු උන්වහන්සේට පැවරීය. පණ්ඩිත නම් වූ ඒ කුමරු තමා සැරියුත් තෙරුන් ළඟ මහණ කරවන්න යැයි අම්මාගෙන් ඉල්ලා සිටියේ ය. සැරියුත් තෙරුන් වහන්සේ තචපඤ්චක කර්මස්ථාන කියවා ඔහු පැවිදි කළහ.

මිනිස් සිරුරේ ඇත්තේ කුණප 32 කි. එයින් 27ක් ශරීර අභ්‍යන්තරයේ ඇත. 05ක් බාහිරව අපට දැකිය හැකි ය. කෙස්,ලොම්, නිය, දත් හා පිටසම අපට පෙනේ. බාහිරින් ඇති මේ පෙනුම බොහෝ දෙනා මගේ කය යනුවෙන් අල්ලා ගනිති. මේ තණ්හා, මාන, දිට්ඨි, අවිජ්ජා ප්‍රහීනයට මේ 05 කෙරෙහි කළකිරවීම තච පඤ්චක කර්මස්ථාන සිහිකිරීමෙන් සිදුවේ.

දිනක් සැරියුත් තෙරුන් වහන්සේ පණ්ඩිත සාමණේරයන් වහන්සේට ඉරියවු පැවැත්වීම් හා කළයුතු වතාවත් කියා දෙමින් ඇතුළු ගමට පිණ්ඩපාතයට වැඩම කළ සේක. අතරමඟ දී ඇළක් දැක මෙයින් ඇති ප්‍රයෝජන කවරේදැයි උපාධ්‍යාය සැරියුත් තෙරුන්ගෙන් ඇසූහ.

තැනින් තැනට දිය ගලා බස්වමින් දෙපස ඇති කුඹුරුවලට යවා ගොයම් කරති'යි වදාළහ. මේ දියට සිතක් ඇත්තේ දැයි ඇසූවිට නැතැයි වදාළහ. එසේ නම් ස්වාමීනි, සිත් පිත් නැති දිය තමන් කැමැති තැනකට ගෙන යන්නේද? එසේ ය ඇවැත්නි'යි පිළිතුරු දුන්හ.

මේ සැටියෙන් සිත් පිත් නැති දියත් තමන් කැමැති තැනට පමුණුවා වුවමනා කටයුතු කරත්නම් සිත් පිත් ඇති සත්ත්වයෝ සිත තම වසඟයෙහි පවත්වා කුමක් හෙයින් මහණදම් පිරීමෙහි අපොහොසත් වන්නේ දැයි සිතන්නට විය.

තව ටිකක් ඉදිරියට ගියේ සාමණේරයන් හී වඩුවකු ඊ කූරක් ගින්නෙහි ලා තව තවා ඇස් කොණින් බල බලා ඇද හරිනු දැක මොවුහු කවුරුදැයි ඇසීය.

"හේ ඊ වඩුවෙකි" "කුමක් කරන්නේ ද?" "ඊ" දඬු ගින්නෙහි ලා ඇද හරිත්" යැයි වදාළහ. "ඊ දණ්ඩට සිතක් තිබේද? නැතැයි වදාළ විට,

මේ සිත් නැති ඊ දඬුත් ගින්නෙහිලා තවා ඇද හරිත් නම් සිත් පිත් ඇති සත්ත්වයෝ තම සිත තමාට නතුකොට ගෙන මහණදම් කරන්නට (යහපතෙහි පමණක් හැසිරවීමට) කුමක් හෙයින් අසමර්ථ දැයි සිතූහ.

තව ටිකක් ඉදිරියට යත්ම දැව් නිම්වළලු බොස් ගෙඩි සඳහා දැව සසින්නන් දැක මොවුන් කරන්නේ කුමක් දැයි ඇසීය.

"මොවුන් ලී දවා දඬු සසින්නේ ය. වනයෙන් ලී කොට ගෙනැවිත් තිරික්කල කරත්ත. බරබාග. බරකරත්ත ආදියට රෝද (අර) බොස්ගෙඩි පට්ටම් සාදති' යි වදාළහ. ඒ ලීවල පණ තිබේදැයි ඇසීය. නැතැයි වදාළ විට මොවුහු මෙලෙසින් සිත් පිත් නැති දැව දඬු සැස කරත්ත රෝද ආදිය සාදත් නම්, සිත් පිත් ඇති මිනිසාට තම සිත් නතුකොට ගෙන මහණ දම් කරන්නට, යහපතෙහි පමණක් තම ජීවිතය මෙහෙයවීමට බැරි කුමක් නිසා දැයි සිතා

"ස්වාමීන් වහන්ස, මගේ පා සිවුර අරගන්නා සේක් නම් මට නවතිනු හැකි යැයි කී ය. මේ ළදරු හෙරණ සැරියුත් උපාධ්‍යායන් වහන්සේ කවුරුන්දැයි නොදැන මෙසේ කියන්නේ'යි සිතමින් දෙන්න යැයි කියමින් තම අතට ගත්හ. හෙරණ තෙරුන් වැඳ නවතින විට පොඩි නමට අනතුරක් වේ යැයි සිතා තම කුටියට වී දොර වසා සිටින්නැයි ද නියම කොට පිණ්ඩපාතය සඳහා ඉදිරියට වැඩි සේක. කුටියට වන් සාමණේරයන් සිය සිරුරෙහි නුවණ බහා ත්‍රිලක්ෂණය සිහි කරන්නට විය. හෙරණගේ මේ ගුණ තෙදින් තැති ගත් සක්දෙව් රජ සිව්වරම් දෙවියන් කැඳවා සාමණේරයන් සිටින කුටිය අවට කිසිදු සතකුට හඬ නොනඟන පරිදි නිහඬ කරවන්නට අණ කළේ ය. හෙරණුන්ගේ සිත එකඟ ය. අනාගාමී ඵලයට පැමිණියේ ය.

හෙරණ තෙරුන් වැඳ නවතින විට පොඩි නමට අනතුරක් වේ යැයි සිතා තම කුටියට වී දෙර වසා සිටින්නයි ද නියම කොට පිණ්ඩපාතය සඳහා ඉදිරියට වැඩි සේක. කුටියට වන් සාමණේරයන් සිය සිරුරෙහි නුවණ බහා ත්‍රිලක්ෂණය සිහි කරන්නට විය.

පිඬුසිඟා වැඩි සැරියුත් තෙරුන් වහන්සේ ආරාධනා පරිදි දායක ගෙයකම සිට පිඬු වළඳා සාමණේරයන්ට පාත්‍රය පුරවා ආහාර දුන් පසු වහ වහා වැඩියේ සාමණේරයන් බඩගින්නේ බව සිතමින් ය. අප බුදුරජාණන් වහන්සේ තෙරණුන්ගේ පළමු ක්‍රියා දිවැසින් දැක මාර්ගඵල අනාගාමී ඵල තෙක් ලැබූ බවත්, රහත්වීම ගුරුහිමියන්ගේ දානය නිසා ප්‍රමාද වන බව දැක තෙරුන්ගේ කුටිය ළඟට වැඩ 'සැරියුත් තෙරුන් නවතා සතර ප්‍රශ්නයක් විමසූහ.

ඒ, දෙබස අසා සාමණේරයන් රහත්ඵලයට පැමිණෙන බව දැනගෙන ය. සතර ප්‍රශ්නය නම්, සැරියුත් ඔබට කුමක් ලැබුණේ ද? ආහාරයෙකි. ආහාරය කුමක් කරයි ද? වේදනා පහ කරයි. වේදනාව කුමක් කරයි ද? රූපය එළවා තබයි. රූපය කුමක් එළ වාද? ස්පර්ශය කෙරේ.

මේ දෙබස අසා සිටි සාමණේරයන් වහන්සේ එයට සිහි එළවා අරහත් ඵලය ලැබූහ. බුදුරජාණන් වහන්සේගේ ආරාධනයෙන් සැරියුත් තෙරුන් සාමණේරයන් වෙත පිළිගන්වා දන් වැළඳවූහ.

මෙසේ වළඳන තෙක් නැවතී සිටි සඳ හිරු ගමන් ඇරඹීය. භික්ෂූන් සාමණේරයන්ගේ දන් වැළඳීම පරිභව මුඛයෙන් කතා කළහ. එතැනට වැඩි බුදුරජාණන් වහන්සේ පින් ඇත්තවුන්ට සඳ හිරු පවා තම විමාන රඳවා තබමින් ගෞරව දැක්වූහ. මම ද දොර කොටුවෙහි රැකවල් දුනිමි'යි ඉහත ගාථාවෙන් අනුසන්දි ගළපා කළ දේශනාව අසා බොහෝ දෙනා සෝවාන් ඵලයට පැමිණියහ.

# බුදුරජාණන් වහන්සේ අරහං නම් වන සේක



සියලු කෙලෙසුන් දුරු කළ බැවින් ද, කෙලෙස් සතුරන් නැසූ බැවින් ද, සංසාර චක්‍රයාගේ ගරාදි බිඳ ලූ බැවින් ද, සිව් පස ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූ බැවින් ද, රහසින්වත් පව් නොකළ හෙයින් ද බුදුරජාණන් වහන්සේට අරහං යයි කියති.

බුදුරජාණන් වහන්සේ තරම් වැඳුම් පිදුම් කිරීමට ගරු බුහුමන් කිරීමට සුදුසු වූ වෙනත් කිසි උතුමෙක් නොමැත. තමන් වහන්සේට වඩා ශීලා දී ගුණයෙන් යුතු කිසිවෙක් තුන් ලෝ තලයෙහි ම නැති බැවින් ධර්ම රත්නය ගුරු තනතුරෙහි තබා ගත් සේක.

භාග්‍යවතුන් වහන්සේගෙන් වන්දනාමානාදිය ලබා ගැනීමට ගරු සැලකිලි ලැබීමට තමන් වහන්සේට වඩා උතුම් වූ, උසස් වූ, හෝ සමාන වූ හෝ කෙනෙක් ඇත්තේ නැත.

"වේරඤ්ජ නම් බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නයක් වූයේ භාග්‍යවතුන් වහන්සේ තමන්ට වඩා වයසින් වැඩි අයකුට ද නොසලකන්නේ ය. ගරු නොකරන්නේ ය. අසුන් පැන වීමක් ද නොකරන්නේ ය. එය එසේ ම ද? යන ප්‍රශ්නයයි.

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. බ්‍රාහ්මණය, මවිසින් වෙනත් අයකුට ගරු සත්කාර කිරීම හෝ ආසන පැනවීමක් හෝ නො කළ යුතු ම වන්නේ ය. එසේ සිදු කළොත් ඒ ගරු සත්කාර ලබන පුද්ගලයාගේ හිස කැපී ඇද වැටෙන්නේ තල්ගෙඩියක් නටුවෙන් සිඳී වැටෙන්නාක් මෙනි. බුදුන් වහන්සේ වදාළ සේක. මේ අරහං ගුණයේ මහාර්ඝත්වය විදහා පාන්නකි.

බුද්ධත්වයට පෙරත් අරහං ගුණයේ බීජ අවස්ථාවන් දක්නට ඇත.

අග්ගෝ හමස්මි ලෝකස්ස, යනුවෙන් සිංහ නාද පතුරුවමින් සත් පියුම් මත පියවර තැබීම කාලදේවල තාපසතුමාගේ හා සුදොවුන් පිය රජතුමාගේ වන්දනාවට ලක්වීම මෙහිදී වැදගත් වන්නේ ය.

අනේපිඬු, විශාඛා ආදි දායක දායිකාවන්ගෙන් ලැබුණ සිව් පස ප්‍රත්‍යලාභ අන් කවරකුට වත් නොලැබුණි. දිව්‍ය බ්‍රහ්මාදීන්ගෙන් ද පුද සැලකිලි ලැබූහ. පිරිනිවීමෙන් බොහේ කලක් ගත වුව ද ලැබෙන සත්කාර අඩු වීමක් නැත. එය ද අරහං ගුණය ඉස්මතු කරන කදිම නිදසුනකි.


තථාගත බුදුපියාණන් වහන්සේට දම්සක් පැවැතුම් දේශනය කරන්නාහ. අත් කිසිවකුට එසේ කළ නොහැක. එයිනුදු අරහං ගුණය ම කියැවේ. චක්‍රායුධයෙන් සතුරන් විනාශ වේ.ධර්ම චක්‍රයෙන් කෙලෙස් සතුරන් විනාශ වේ. මජ්ඣිම නිකායේ සේල සූත්‍රයෙන් පැහැදිලි වන වැදගත් කරුණක් දැක්විය හැකි ය.

"රාජා හමස්මි සේල
ධම්මරාජා අනුත්තරා
ධම්මේන චක්ඛං වත්තේමි
ලෝකේ අප්පටි වත්තියං "

"සේලය, මම ධර්ම රාජ වෙමි. අනුත්තර වූ ධර්මරාජ වෙමි, නොපෙරළිය හැකි ධර්ම චක්ත්‍රය මම දැහැමින් ලෝකයාට දේශනා කරමි" යන අරුතයි.

රතන සූත්‍රය, ධජග්ග සූත්‍රය, ඛන්ධ පිරිත, මෝර පිරිත යන පිරිත් සූත්‍ර, දේශනාවන්හි ආඥා බලය කෝටි ලක්ෂයක් සක්වලයන්හි පැතිර පවතී. එයින්ද අරහං ගුණයම කියැවේ.


"සච්චක" බුදුරදුන් ඉදිරියේ දී අන්ත පරාජයකට පත්විය.



දෙමැද, දැරණියගල ශ්‍රී චිත්ත විවේකාරාමයේ
**ඇටම්පොල ඥාණිස්සර හිමි**

අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක සැරියුත්, මුගලන් දෑගසව්වන් වහන්සේ මීට පෙර අනෝමදස්සී නම් බුදුරජාණන් වහන්සේගෙන් විවරන ලබා අගසවු තනතුරු ලැබූහ. ඒ අනෝමදස්සි ලොව්තුරු බුදු පියාණන් වහන්සේගේ අරහං බුද්ධ ගුණය නිසා ම ය.

කරුණු මෙසේ හෙයින් අරහං ගුණයේ මහත්වය ලියා හෝ කියා නිම කළ නොහැකි ම ය.



දුටුගැමුණු මහ රජතුමා

77 කොටස

# ගැමුණු බලකාය විජිතපුරට පැමිණි පසුව පෙරළියක් සිදුවේවි

**"එළාර රජුට විරුද්ධ දෙමළ මිනිසුන් ඕනෑතරම් සිටිනවා. දෙමළ නොවන ඉන්දියානුවන් බොහෝ දෙනෙක් මෙහි ඉන්නවා. ඒ හැමෝම මේ රටේ සංස්කෘතිය, භාෂාව පිළිඅරගෙන රටට ආදරය කරමින් මෙහි ජීවත් වන අය. සිංහලයන් සමඟ සමඟියෙන්, සහයෝගයෙන් ජීවත්වෙන ඒ අය එළාර රජුගේ පරාජය බලාපොරොත්තු වෙනවා. එම පිරිසත් හඳුනාගෙන ඉදිරියට යන්නට ඕනෑ"**

කුණ්ඩල බ්‍රාහ්මණතුමාගේ කතාවට සවන් දෙමින් සිටි තිදෙනාට ලජ්ජාවක් ඇති වූයේ තමන් වෙසෙන රට ගැන දත යුතු මෙබඳු කරුණු කෙරෙහි මෙතෙක් අවධානයක් යොමු නොකළ බැවිනි.

අමිතා, රිදී තැටියක තබාගත් ඔසු පැන් බඳුන් හතරක් ගෙන පැමිණියා ය. ඔසු පැන් සුවඳ ශාලාව පුරාම පැතිරිණි. පොල්පලා සහ හාතාවාරිය එකට තම්බා පෙරා ගත් ඔසු පැන් පොල් හකුරුත් සමඟ බීමට පියා කැමැති බව අමිතා දනී. අනෙක් අයගේ කැමැත්ත ගැන නොදත් ඇය "අවශ්‍ය නම් කොත්තමල්ලිත් තල් හකුරුත් ගෙන ආ හැකියි" කීවා ය.

"නැහැ දියණිය. අවශ්‍ය නැහැ. මේ වෙලාවට මේ ඔසුපැන් හොඳ බීමක් "කුණ්ඩල බ්‍රාහ්මණතුමා  ස්තූති මුඛයෙන් පැවසීය.

"අමිතාත් ළඟ තිබෙන අසුනක වාඩිවෙන්න. රහසිගතව යුද්ධයට සූදානම් වන අනුරාධපුර තරුණ කාන්තාවන්ගේ නායිකාව ඇයයි. ඇය ප්‍රමුඛ තරුණියන් පනස් දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් යුද්ධයට අදාළ ශිල්ප පුහුණු වෙනවා."

"මහ සිටුතුමනි, මම මුලදීම කීවාක් මෙන් අපි බොහෝ ශක්තිමත්. මේ යුද්ධයෙන් දුටුගැමුණු රජතුමා ජයග්‍රහණය කරනවා ස්ථිරයි. හැබැයි ප්‍රමාද වේවි. විජිතපුර බලකොටුව ජය ගන්නට කාලයක් ගත වේවි. මහියංගන බලකොටුවේ අධිපති ඡත්‍ර, යුද්ධ වීරයෙක්."

"ඒ කොහොම වුණත් දුටුගැමුණු පිලේ මුලින්ම ඉන්නේ මේ රටේ ජනතාවගේ වීර මාතාව. ඇය රණකාමියි. දුර දක්නා නුවණින් යුක්තයි. එළාර රජු කියන විදියට මහම කපටි අම්මණ්ඩි,

දුටුගැමුණු රජතුමාට උපදෙස් දෙන්නේ දාව ආචාර්ය තුමා. එතුමා මහා බුද්ධිමතෙක්. මහා පඬිවරයෙක් වන ත්‍රිපිටකතිස්ස මහ තෙරුන් වහන්සේ තුන්කල් දක්නා ඉසිවරයෙක්.

මහාසිව මහාස්වාමීන් වහන්සේත් පරසිත් දන්නා මහා පඬිවරයෙක්. උන්වහන්සේලා ළඟ හෝ දුරක සිට කරන ආශිර්වාදය ජයග්‍රහණයට හේතු වේවි. ජයග්‍රහණය දකින විට දෙපිලේ ම සිංහල සෙබළුන්ගේ උනන්දුව වැඩි වේවි.

"මහා ලේ වැගිරීමක් තමයි. ඒත් සිංහලයන්ට තමන්ගේ රට පරසතුරන්ගෙන් විනාශ වෙනවා බලා ඉන්නට පුළුවන් ද?

"යුද්ධ මණ්ඩල රැස්වීමට කලින් තබන, මහ සෙනෙවිවරුන්ගේ සාකච්ඡාවක් හෙට යුද්ධ සම්මන්ත්‍රණ ශාලාවේ දී රජතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙනවා. රාජ සභාවේ දී ගත් තීරණ වෙනස් නොකර තබා ගන්නට හැකි වුවහොත් ගැමුණු පිලට වාසි රැසක් අත්පත් කර ගත හැකියි" සිරිනාග කීය.

"සිරිනාග රහස් ඔත්තු සේවයේ යෙදෙමින් ඔවුන්ගේ සිත දිනාගෙන ඉන්න. ඔවුන්ගේ සැලසුම් අවාසි සහගත වන තැන් ගැන සැලකිල්ලෙන් ඉන්න. කෙසේ වුවත් විජිතපුර බලකොටුවට ගැමුණු පිරිස ළං වෙන විට කිසියම් පෙරළියක් සිදුවේවි."

කුණ්ඩල බ්‍රාහ්මණ තුමා ද ත්‍රිපිටකතිස්ස මහතෙරුන් වහන්සේ මෙන් නිවැරැදිව අනාවැකි කියන්නකු බව සිරිනාගට වැටහිණි. ඒවා බොහෝ නිවැරැදි විය හැකි බව ඔහුට සිතිණි.

තවත් හෝරා දෙකක් පමණ යුද්ධය, රාජ්‍ය පාලනය, වෙළඳාම, කෘෂිකර්මය ගැන කතා කරමින් සිටි කුණ්ඩල බ්‍රාහ්මණ තුමා කාගේත් ආචාර මැද ගොස් අස්රියට නැඟුණේ ය.

මිත්‍ර මහ සෙනෙවිගේ මන්දිරය දැන් සිරිනාග මහ සෙනෙවිගේ නිල නිවාසයයි. අත්‍යවශ්‍ය කරුණක දී එහි යනු මිස මොහොතක් හෝ එහි රැඳී සිටින්නට බෝධිනාගගේ කැමැත්තක් නැත.

තම පියා වූ අසේල රජුගේ සතුරකු බව දැන දැනම  එළාර රජුගේ සෙනවියකු ලෙස සේවය කරන්නට කැමති වීමෙන් ආත්මාර්ථකාමියකු බව ප්‍රකට විය. දේශ ද්‍රෝහියකු විය. මේ නිසා මිනිසුන් ඔහු දෙස බැලුවේ පිළිකුලෙනි.

ධන තණ්හාවෙන්, බල ලෝභයෙන් පිරී ගිය ඔහු රාජ්‍ය බලය යොදාගෙන අයුතු වැඩ රාශියක් කළේ ය. සමන්තී කෙරෙහි දැක්වූ ආදරය ද ව්‍යාජ බොරුවක් බව මිත්‍රගේ චරිතය පිළිබඳ කල්පනා කිරීමේ දී බෝධිනාගට වැටහිණි.

විමලී විනාශ කිරීම ට සමාව දිය නොහැකි කරුණක් වුව ද ඔහුගෙන් පලිගැනීමෙන් වැළකී සිටියේ ඇයගේ ඉල්ලීම නිසා ය. විමලී වෙනුවෙන් තම සිතෙහි හටගත් ආදරය තවමත් මැකී ගොස් නැත. ඇය වෙනුවෙන් සිරිනාගට ආදරය කළ යුතු ය. රැක ගත යුතු ය. යන හැඟීම නිසා බෝධිනාග ඔහු වෙනුවෙන් වෙහෙසෙයි.

ජයනාථ මහ සිටුතුමාගේ දියණිය අමිතා, සිරිනාග කෙරෙහි පිළිබඳ සිත් ඇතිව පෙමින් සිටිති'යි බෝධිනාගට හැඟී ගොස් තිබිණි. කෙසේ හෝ දෙපැත්තේ ම කැමැත්තෙන් එම විවාහය සම්මත වීම ඔහුගේ සතුටට හේතු විය.

"පියාණෙනි අද මෙහි නවතින්න. හෙට පෙරවරුවේ මා වෙනුවෙන් කළ යුතු රහසිගත රාජකාරියක් තිබෙනවා."

සිරිනාගගේ පෙරැත්තය නිසා ඔහු එදා රැය එහි ගත කළේ ය.

පසුදා අලුයම අවදි වී ගෙඋයනේ සක්මන් කරමින් සිටි බෝධිනාග තාප්පය අසල වූ මිරිවැඩි සඟල හඳුනා ගත්තේ ය. එතැන තාප්පයට හේත්තු කළ ලෑල්ලක් ද විය. ඔහුට එක්වරම සිහිවූයේ සුමන මහ සිටුතුමාගේ මරණයත් සමඟ සිදුවූ සිටු මැදුරේ වස්තුව කොල්ල කෑම ගැනයි. මේ මැදුරේ මොන මොන දේවල් ඇද්දැයි සොයා බලන සිතක් බෝධිනාගට ඇති විය.

උදය ආහාර ගනිමින් සිරිනාග කතා කළේ ජයනාථ මහ සිටුතුමාගේ කැපවීම ගැන ය.

"සුමන මහ සිටුතුමාගේ ගතිගුණ ජයනාථ මහ සිටුතුමාටත් තියෙනවා. සිටු දේවියත්, සිටුකුමරියත්, නිහතමානියි. පරාර්ථකාමියි. ඒ නිසාමයි මම ගොවිතැන් භාරව කටයුතු කළේ" සිරිනාගගේ අදහස බෝධිනාග ද අනුමත කළේ ය.

අයන්ති විතාන